# බන්ධනාගාර තුළ පවත්නා තදබදය කළමනාකරණය කිරීම පිළිබඳ කාර්යසාධන විගණනය




වාර්තාවේ අංකය:ජේඑල්ඕ/සී/ඩී/ඩීඊපී/2022/19

## ජාතික විගණන කාර්යාලය

# පටුන


| අනු අංකය | | විස්තරය | පිටු අංකය |
|---|---|---|---|
| **01** | | **විධායක සාරාංශය** | 1 |
| **02** | | **හැඳින්වීම** | 4 |
| | 2.1 | පසුබිම | 4 |
| | 2.2 | විගණනය සඳහා අධිකාර බලය | 9 |
| | 2.3 | විගණන ප්‍රවේශය | 10 |
| | 2.4 | විගණන අරමුණු හා නිර්ණායක | 11 |
| | 2.5 | විගණන ක්‍රමවේදය | 13 |
| | 2.6 | විෂය පථය හා විෂය පථයේ සීමාවන් | 14 |
| 03 | | **විස්තරාත්මක විගණන නිරීක්ෂණ** | 16 |
| | 3.1 | බන්ධනාගාර ධාරිතාවය | 16 |
| | 3.2 | බන්ධනාගාර තදබදය ඇතිවීමට හේතු | 23 |
| | 3.3 | බන්ධනාගාර තදබදය තුලින් මතුවන ගැටළු | 30 |
| | 3.4 | බන්ධනාගාර තදබදය අවම කිරීමට මෑතකදී ගෙන ඇති පියවර | 41 |
| 04 | | නිර්දේශ | 49 |
| | | උපලේඛන | 51 |

## 01. විධායක සාරාංශය

බන්ධනාගාරයක ස්වරූපය පිළිබඳව එංගලන්තයේ ජෝන් හොවාර්ඩ් (John Horward) විසින් කරන ලද අධ්‍යනය අනුව, බන්ධනාගාර පිරිසිදුව, ඉඩකඩ සහිතව, අධ්‍යාපනික හා ආගමික ඉගැන්වීම් සිදු කළ යුතු අතර අදාළ පුද්ගලයන් ඉවත් වී ගිය පසුවත් ඔවුන් පිළිබඳව සොයා බැලිය යුතු ආයතනයක් ලෙස හඳුනාගෙන ඇත. සිරකරුවෙකු අපරාධකරුවකු ලෙස රඳවාතබමින් ඔහු කායිකව හා මානසිකව පීඩනයට ලක් කර වරදට දඬුවමක් දිය යුතුය යන තර්කනය හා වරදේ ප්‍රමාණයට හානියක් සිදු කළ යුතුය යන සංකල්පය අතීතයේ බන්ධනාගාර පද්ධතිය තුළ පැවතිණි. මෙම සංකල්පය එකල සිටි විශ්ලේෂණ වාදීන්ගෙන් හා සමාජ ශෝධකයින්ගෙත් දැඩි විවේචනයට ලක් විය. මෙම කරුණු පදනම්කරගෙන බන්ධනාගාරය වදකාගාරයක් නොවිය යුතු අතර එය සමාජ ශෝධකාගාරයක් විය යුතුය යන තර්කය ගොඩ නැගුණි. මේ හේතුවෙන් වදකාගාරයක් ස්වරූපයෙන් පැවති බන්ධනාගාර වරිත ශෝධකාගාර බවට පත්වී විශෝධන ප්‍රතිපත්තිය මුල්කර ගනිමින් සිරකරුවන් පාලනය කිරීමක් සිදු කරයි.

ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ඉතිහාසය සලකා බැලීමේ දී අතීතයේ විධිමත් බන්ධනාගාරයක් තිබූ බවට සාක්ෂි නොමැත. බ්‍රිතාන්‍ය පාලන කාලය තුළදී විධිමත් බන්ධනාගාර ආරම්භ වී ඇත. 1832 වර්ෂයේදී කැමරන් ආණ්ඩුකාරවරයා විසින් හඳුන්වා දෙන ලද අධිකරණ ප්‍රතිසංස්කරණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1844 අංක 18 දරණ නීති හා අධිකරණ ආඥා පනතට අනුව බ්‍රිතාන්‍ය බොස්ටල් ක්‍රමයට අනුරූපව වැලිකඩ බන්ධනාගාරය ගොඩ නැගුණි. සිරකරුවන් රඳවා තබා ගැනීම, ඔවුන්ගේ ශ්‍රමයෙන් වැඩ ගැනීම බන්ධනාගාර තුළින් ආරම්භයේ දී බලාපොරොත්තු විය. පසුව 1877 අංක 16 දරන බන්ධනාගාර පනතට අනුව 1905 ජූලි 16 වන දින බන්ධනාගාර දෙපාර්තමේන්තුව බිහිවිය.මේ අයුරින් විකාශනය වූ බන්ධනාගාර දෙපාර්තමේන්තුව අද වන විට දිවයින පුරා ආරක්ෂිත බන්ධනාගාර 04 ක්, රිමාන්ඩ් බන්ධනාගාර 18 ක්, තරුණ වරදකරුවන්ගේ විශෝධන මධස්ථාන 02 ක්, වැඩ කඳවුරු 10 ක්, විවෘත වැඩ කඳවුරු 02 ක්, සිර මැදිරි 23 ක්, බන්ධනාගාර පාසලක්ද වශයෙන් ව්‍යාප්ත වී ඇත.වර්ථමාන සමාජ සංකීර්ණත්වය හමුවේ බන්ධනාගාර පද්ධතිය සුවිශේෂ වූත් අත්‍යාවශ්‍ය වූත් ආයතනයක් බවට පත්ව තිබේ.

පිළිගත් ජාත්‍යාන්තර ප්‍රමිතීන්ට අනුකූලව හා ජාතික නීති පද්ධති, රෙගුලාසි, හෝ වෙනත් මාර්ගෝපදේශ පදනම් කරගත් ප්‍රමිතීන්ට අනුකූලව මානසික හා ශාරීරික යෝග්‍යතාවයට ගැලපෙන ආකාරයට ඉඩ පහසුකම් සහිතව යම් බන්ධනාගාරයක රැඳවිය හැකි රැඳවියන් ප්‍රමාණය බන්ධනාගාර ධාරිතාවය වේ. 2022 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර ධාරිතාවය තුළ රැඳවිය හැකි රැඳවියන් ගණන 11,291 වන නමුත් බන්ධනාගාර රැකවරණය යටතේ සැකකරුවන් 16,727 ද සිරකරුවන් 9,449 ක් වශයෙන් රැඳවියන් 26,176 ක ප්‍රමාණයක් සිටිති.

ඒ අනුව 2022 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර ධාරිතාවය ඉක්මවා සිටින රැඳවියන්ගේ ප්‍රතිශතය සියයට 232 කි. විගණන භෞතික පරීක්ෂාවලදී සිර මැදිරිවල හා වාට්ටුවල බන්ධනාගාර ධාරිතාවය ඉක්මවා සිරකරුවන් රඳවා තිබෙන බව නිරීක්ෂණය විය. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අතර හත්වන කාර්යය ලෙස බන්ධනාගාර ප්‍රතිසංකරණ ක්‍රියාත්මක කිරීමට අදාළව බන්ධනාගාර තදබදය අවම කිරීම සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීම, භෞතික සම්පත් වැඩි දියුණු කිරීම හා යටිතල පහසුකම් සංවර්ධනය දක්වා තිබුණ ද වර්ථමානයේ බන්ධනාගාරවල පවතින තදබදය බන්ධනාගාර පද්ධතිය කළමනාකරණය කිරීමෙදී ප්‍රධාන ගැටළුවක් බවට පත්වී ඇත. මෙම කාර්යසාධන වාර්තාව සැකසීමේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ බන්ධනාගාර පද්ධතිය තුළ පවතින තදබදය හා එයට හේතු හඳුනා ගැනීමත්, එම හේතු නිසා ඇතිවන ගැටළු හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීමටත් ය.

බන්ධනාගාර තදබදය ඇතිවීමට බලපා ඇති ගැටළු ලෙස රැඳවියන් නඩත්තු කිරීම සඳහා රජය විශාල පිරිවැයක් දැරීම, (2022 වර්ෂය සඳහා රුපියල් බිලියන 8.3 ක් ) සිරකරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධ ගැටළු, සනීපාරක්ෂක පහසුකම් ගැටළු, සැකකරුවන් වන රැඳවියන්ගේ ශ්‍රම දායකත්වය රටේ ආර්ථිකයට යොදාගත නොහැකි වීම, රැඳවියන් පුනරුත්ථාපනය සම්බන්ධ ගැටළු, සිරකරුවන් නැවත නැවත සිරගතවීම, සුළු වරදවල් සඳහා ප්‍රජා විශෝධන නියෝග ලබා දීමේ ප්‍රමාණය අඩුවීම්, ප්‍රජා විශෝධන නියෝග කඩකිරීම් වැඩිවීම්, නිවාස නිවාඩු ලබා දීමේ ක්‍රමය, බලපත්‍ර මත මුදාහැරීමේ ක්‍රම සාර්ථකව ක්‍රියාත්මක නොවීම, බන්ධනාගාර තදබදය අවම කිරීම සඳහා මෑතකදී ක්‍රියාත්මක වූ වැඩ සටහන් අපේක්ෂිත මට්ටමින් ඉටුනොවීම, 2022 දෙසැම්බර් 31 දිනට සමස්ථ රැඳවියන්ගෙන් සියයට 53 ක් මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි නිසා බන්ධනාගාර ගත වීම, ඇප කොන්දේසි සපුරාලීමට නොහැකි වීම නිසා සිරගතව සිටීම, රස පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රසපරීක්ෂණ වාර්තා කාලීනව අධිකරණයට ඉදිරිපත් නොකිරීම්, ප්‍රජා විශෝධන නියෝග පිළිබඳව මහජනතාවගේ දැනුවත් භාවය ප්‍රමාණවත් නොවීම, පවතින ගොඩනැගිලි අබලන් තත්ත්වයේ පැවතීම, සැකකරුවන් දීර්ඝ කාලයක් රක්ෂිත බන්ධනාගාරගත වීම්, සිරකරුවන් වැඩි ප්‍රමාණයක් වයස අවුරුදු 30 – 40 අතර වීම, පුනරුත්ථාපනය සඳහා භෞතික හා මානව සම්පත් හිඟවීම, සිරකරුවන් පෞද්ගලික අංශවල සේවයේ යෙදවීමේ කොන්දේසි ප්‍රමාණවත් ලෙස ඉටු නොවීම, රැඳවියන් පූර්ණ වර්ගීකරණයකින් තොරව රඳවා තැබීම් නිරීක්ෂණ ලෙස දැක්විය හැකිය.

මෙම වාර්තාව තුළින් බන්ධනාගාර තදබදය ප්‍රමාණවත් පරිදි අවම කර ගැනීම උදෙසා නිර්දේශ ලෙස 1877 අංක 16 දරණ බන්ධනාගාර ආඥා පනතේ 54 වන අධිකාරයට අදාළව සිදුකරන ලද සංශෝධනයන් හි 178 හා 179 පරිච්ඡේදයේ විධිවිධානවලට අනුව කටයුතු කිරීම, නැවත නැවත සිරගත වීම අවම කිරීම සඳහා ශක්තිමත් හා ප්‍රමාණවත් පුනරුත්ථාපන ක්‍රියාවලියක් ඇති කිරීම සහ ජීවනෝපාය පුහුණු කිරීම් ශක්තිමත් කිරීම, පූර්ව නඩු විභාග රඳවා

ගැනීම් චෝදනා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් අවම කිරීමට අදාළ පාර්ශවයන් මෙහෙය වීම, රිමාණ්ඩ් බන්ධනාගාර කිරීම වෙනුවට නිවාස අඩස්සියේ තබා ගැනීම වැනි විකල්ප පිළිගත් ක්‍රම ශ්‍රී ලංකා අපරාධ යුක්ති පද්ධතියට හඳුන්වා දීම පිළිබඳව අවධානය යොමු කර සුදුසු පියවර ගැනීම, 2022 අංක 41 දරන විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග සංශෝධන පනතේ 54 වන වගන්තිය අනුව අධිකරණය මගින් බන්ධනාගාර ගත කරන සැකකරුවන්ට අදාළව පොලිස් දෙපාර්තමේන්තුව විසින් රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන නියැදි (sample)වලට අදාළ රස පරීක්ෂක වාර්තා අධිකරණයට අප්‍රමාදව ඉදිරිපත් කිරීම, අපරාධ යුක්ති දාම ප්‍රවේශයේ පවතින ආයතන අතර සහයෝගිතා යාන්ත්‍රණය වැඩි දියුණු කිරීම සහ හැකිතාක් නවීණ තාක්ෂණය උපයෝගී කර ගැනීම, බන්ධනාගාර තදබදය හා අනෙකුත් ගැටළු සම්බන්ධව බන්ධනාගාර පරිපාලකයන් හා අධිකරණ නිලධාරීන් දැනුවත් කිරීම හා කාර්යක්ෂම අධීක්ෂණ යාන්ත්‍රණයක් පවත්වා ගැනීම, නේවාසිකයින්ගේ නවාතැන් හා රැකවරණය සඳහා වූ ජාත්‍යන්තර හා ජාතික ප්‍රමිතීන්ට අනුකූලව රැඳවියන් බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීම, බන්ධනාගාර කළමනාකරණයට පහසු වන පරිදි සමාජ ආරක්ෂණයට හානියක් නොවන සේ මත්ද්‍රව්‍ය වැරදි හා සම්බන්ධ නීති සංශෝධනය කිරීම පිළිබඳව අවධානය යොමු කිරීම, පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මානව හා භෞතික සම්පත් ප්‍රමාණවත් පරිදි යොදවා ගැනීම සහ අවශ්‍ය සංශෝධනයන් සිදු කිරීම, තාවකාලිකව ක්‍රියාත්මක කිරීම අත්හිටුවා ඇති වැලිකඩ බන්ධනාගාර සංකීර්ණය සුදුසු ප්‍රදේශයක ස්ථාපිත කිරීම, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යමණ්ඩලයේ දැනට පුරප්පාඩු වී ඇති අත්‍යාවශ්‍ය තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීම කඩිනමින් සිදු කිරීම, බන්ධනාගාරවල අබලන්ව ඇති සනීපාරක්ෂිතභාවයෙන් හා ආරක්ෂිතභාවයෙන් අඩු ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම හෝ නව ගොඩනැගිලි ඉදිකර රැඳවියන්ගේ මානුෂික අවශ්‍යතා ඉටු කිරීම, රැඳවියන්ගේ ශ්‍රමය හා දැනුම සමාජයීය වශයෙන් ඵලදායී කාර්යය සඳහා යොමු කරවීම වර්ධනය කිරීම, බන්ධනාගාර නේවාසික තදබදය අවම කර විධිමත් පුනරුත්ථාපන ක්‍රියාවලියක් මඟින් නේවාසිකයින් යහපත් පුරවැසියන් ලෙස සමාජ ගත කිරීමට නිර්දේශ කෙරේ.

## 2. හැඳින්වීම

### 2.1. පසුබිම

බන්ධනාගාර දෙපාර්තමේන්තුව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන්නකි.

#### 2.1.1. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මෙහෙවර, දැක්ම, අරමුණු හා ප්‍රධාන කාර්යයන්

(අ) මෙහෙවර

ආරක්ෂාව, රැකවරණය, පුනරුත්ථාපනය යන මූලික අරමුණු ඉටුකර ගැනීම උදෙසා නේවාසිකයින් හා බන්ධනාගාර නිලධාරීන් අතර මනා සම්බන්ධතාවයක් නිර්මාණය කරමින් ධනාත්මක චින්තනයක් ගොඩනගා නිලධාරීන්ගේ රැකියා තෘප්තිය වැඩි කිරීම තුළින් සහ සිරකරුවන්ගේ සුභසාධක කටයුතු විධිමත් කිරීම තුළින් ඔවුන්ගේ ශ්‍රම ඵලදායීතාවය රටට වැඩදායී ලෙස යොදාගැනීම.

(i.) සිරකරුවන්ගේ ආරක්ෂාව :-

අධිකරණය වෙත ඉදිරිපත් කිරීම, නියමිත සිර දඩුවම ක්‍රියාත්මක කිරීම, ආරක්ෂාකාරීව රඳවා තබා ගැනීම.

(ii.) සිරකරුවන්ගේ රැකවරණය :-

නියමිත පෝෂණය සහිත ආහාර සැපයීම, සනීපාරක්ෂක පහසුකම් සැලසීම, සෞඛ්‍ය පහසුකම් සැලසීම.

(iii.) පුනරුත්ථාපනය :-

වෘත්තීය නිපුණතාවල යෙදවීම. (කෘෂිකාර්මික/ සත්ත්වපාලන/ කර්මාන්ත), වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා සහභාගී කරවා ගැනීම, විධිමත්, නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් වලට සහභාගී කරවා ගැනීම, සංස්කෘතික හා ආගමික කටයුතු වලට යොමු කිරීම, ක්‍රීඩා කටයුතු වල යෙදවීම

(ආ) දැක්ම

නේවාසිකයින් පුනරුත්ථාපනය තුළින් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම

(ඇ) අරමුණු

(i.) බන්ධනාගාර නේවාසිකයින් විධිමත් පුනරුත්ථාපනය මගින් නීති ගරුක මානව හිතවාදී පුද්ගලයන් බවට පත් කර ශිෂ්ට සම්පන්න සමාජයක් බිහි කිරීමට දායක වීම.

(ii.) බන්ධනාගාර නිලධාරීන් අභිප්‍රේරණය සහ දෙපාර්තමේන්තු කණ්ඩායම් හැඟීම ගොඩනැගීම

(ඈ) ප්‍රධාන කාර්යයන්

(i.) රට තුල කවර හෝ අධිකරණයක අධිකාරී බලය යටතේ බන්ධනාගාර ගත කරන ලද හෝ රිමාණ්ඩ් භාරයට පත් කරන ලද සෑම තරාතිරකම සිරකරුවන් පිළිගැනීම සහ බන්ධනාගාර නීතිරීති වලට අනුකූලව ඔවුන්ගේ ආරක්ෂාව,රැකවරණය හා නඩත්තුව සැපයීම සහ අධිකරණ වලට රිමාණ්ඩ් සිරකරුවන් ඉදිරිපත් කිරීම.

(ii.) සියළුම බන්ධනාගාර සිර කඳවුරු හා චරිත ශෝධනාගාර සම්බන්ධ පොදු විධානය හා මනා පරිපාලනය සැලැස්වීම.

(iii.) සියළුම බන්ධනාගාර සිර කඳවුරු හා චරිත ශෝධනාගාර වල රැඳවියන් සඳහා කාර්මික, කෘෂිකාර්මික, සත්ව පාලනය හා වෘත්තීය පුහුණුව ලබා දීම.

(iv.) සියළුම බන්ධනාගාර සිර කඳවුරු හා චරිත ශෝධනාගාර සඳහා සුභසාධක සේවා සැපයීම.

(v.) විශෝධන ක්ෂේත්‍රයක් සවිමත් කිරීමට අවශ්‍ය පුහුණු කිරීම් සඳහා විධිවිධාන සැලසීම.

(vi.) කාලීන අවශ්‍යතාවයට ගැලපෙන පරිදි රැඳවියන් පුනරුත්ථාපනය කර යහපත් පුරවැසියන් ලෙස පිටත් වීමට අවශ්‍ය සමාජ පසුබිම සැකසීම.

(vii.) බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අදාළව බන්ධනාගාර තදබදය අවම කිරීම, නවීන තාක්ෂණය හඳුන්වා දීම, භෞතික සම්පත් වැඩිදියුණු කිරීම හා යටිතල පහසුකම් සංවර්ධනය.

(viii.) සේවා අංශයන්ට අදාළ පුහුණු හා වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම තුළින් මනා පරිචයකින් හා සේවා තෘප්තියකින් යුත් නිලධාරීන් බිහි කිරීම සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය.

(ix.) රැඳවි පරිපාලන කටයුතු වඩාත් විධිමත්ව හා කාර්ක්ෂමව ඉටු කිරීම උදෙසා රැඳවියන්ගේ තොරතුරු කළමණාකරණ පද්ධතිය ස්ථාපනය කර ක්‍රියාත්මක කිරීම.

**2.1.2. බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන**

| | ආයතනය/ප්‍රධාන මධ්‍යස්ථානයේ නම | අදාල ආයතනය /මධ්‍යස්ථානය යටතේඇති ආයතන |
|---|---|---|
| (i.) | බන්ධනාගාර මූලස්ථානය | බන්ධනාගාර මූලස්ථානය තුළ පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානය |
| (ii.) | ආරක්ෂිත බන්ධනාගාර | වැලිකඩ, බෝගම්බර, මහර, අඟුණකොලපැලැස්ස, බූස්ස |
| (iii.) | රිමාන්ඩ් බන්ධනාගාර | අනුරාධපුරය, කොළඹ, කළුතර,මීගමුව, ගාල්ල, නව මැගසින්, බදුල්ල, මාතර, මඩකලපුව, කෑගල්ල, ත්‍රිකුණාමලය, යාපනය,කුරුවිට, මොණරාගල, පොළොන්නරුව, වාරියපොල, වවුනියාව |
| (iv.) | වැඩ කඳවුරු | හෝමාගම, මීතිරිගල, වීරවිල, කුරුවිට, වාරියපොල, හංගිලිපොල, කන්දෙවත්ත, කඳුරුගස්ආර, පිටබැද්දර, අඹේපුස්ස |
| (v.) | විවෘත වැඩ කඳවුරු | පල්ලෙකැලේ, අනුරාධපුර |

| | | |
|---|---|---|
| (vi.) | තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය | පල්ලන්සේන, තල්දෙන |
| (vii.) | සිර මැදිරි | අම්පාර, අවිස්සාවේල්ල, බලංගොඩ, බලපිටිය, හලාවත, ඇල්පිටිය, ඇඹිලිපිටිය, ගම්පහ, ගම්පොළ, හම්බන්තොට, හැටන්, කල්මුනේ, කිලිනොච්චිය, කුලියාපිටිය, කුරුණෑගල, මහව, මන්නාරම, මාතලේ, මුලතිව්, නුවරඑළිය, පානදුර, පේදුරුතුඩුව, පුත්තලම |

### 2.1.3. අර්ථකතනය

බන්ධනාගාරය තුළ අර්ථදැක්වෙන ආකාරයට එක් එක් ආයතන අර්ථ දක්වා ඇති ආකාරය පහත පරිදිය.

(අ) බන්ධනාගාර :-

වැඩිහිටි සිරකරුවන් රඳවන ස්ථානයකි. ආරක්ෂාව සඳහා බන්ධනාගාරය වටා තාප්පයක් ඇත. දැඩි ආරක්ෂක සංවිධාන හා ආරක්ෂිත සිර මැදිරි ඇත.දඬුවම්ලත්, දඬුවම් නොලත් හා අභියාචනා වැනි සෑම වර්ගයකම සිරකරුවන් සිටීයි. රැඳවීමේ කාලය සීමා කර නොමැත. දඬුවම්ලත් අයගේ ඇඳුම ජම්පරය හා කලිසම වේ. වැඩිහිටි අධ්‍යාපන ක්‍රමයක් ඇත. බන්ධනාගාරයෙන් පැනගියහොත් උපරිම අවු 05 දක්වා සිර දඬුවමක් කළ හැකිය. දඬුවම්ලත් සිරකරුවන් බන්ධනාගාරයට ඇතුලත් කරන්නේ දඬුවමක් ලෙසයි. ඔවුන්ට රජයේ රැකියාවක් ලබාගැනීමේ හිමිකම් අහිමි වේ. සිරකරුවන් සඳහා පිරිනමන සිර සමාවල් හිමි වේ.

(ආ) රක්ෂිත බන්ධනාගාර :-

තාප්පවලින් වට කොට ඇත. සැකකරුවන් සඳහා වෙන් කරයි. නිරන්තර උසාවි කටයුතු පවතියි. සුළු වශයෙන් වෘත්තිය පුහුණු, පුනරුත්ථාපන/ උපදේශන හා පුහුණු වැඩසටහන් ඇත. ගෘහ සේවය සඳහා කෙටිකාලීන සිරකරුවන් යොදවයි.

(ඇ) එළිමහන් සිර කඳවුරු :-

මෙය දඬුවමින් ¼ ගෙවුනු හා ඉතිරිය වසර 5 ක් නොවූ සිරකරුවන් සඳහා පමණි. තාප්ප නැත. නිදහස් පරිසරයක් ඇත. කෘෂිකාර්මික හා පශු සම්පත් කටයුතු සඳහා යොදවයි. විවෘතව අමුත්තන් හමුවීමට අවස්ථාව ඇත.

(ඇ) වැඩ කඳවුරු :-

නිදහස් වීමට අවුරුදු 5 ට අඩු සිරකරුවන් රඳවා තබයි. සිරකරුවන් සඳහා පමණක් වෙන්ව ඇත. පවුරු නැත. නිදහස් පරිසරය. කෘෂිකර්මය හා සත්ව පාලනය සඳහා යොදවයි. විවෘතව අමුත්තන් බැලීමට අවස්ථාව ඇත. පුනරුත්ථාපන/ උපදේශන හා පුහුණු වැඩසටහන් ඇත. අවම ආරක්ෂාවක් යොදවයි. මෙහි උසාවි කටයුතු නැත

(ඉ) තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථාන :-

වයස අවුරුදු 16-22 අතර අය රඳවා තබා ගනියි. නිදහස් පරිසරයක් ඇත. කෘෂිකර්මය හා සත්ව පාලනය සඳහා යොදවයි. විවෘතව අමුත්තන් බැලීම සඳහා අවස්ථාව ඇත. පුනරුත්ථාපන/ උපදේශන හා පුහුණු වැඩසටහන් ඇත. අවම ආරක්ෂාවක් යොදවයි. උසාවි කටයුතු නැත.

(ඊ) තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාල :-

වසර 3 ක දඬුවම් කාලයක් හිමි අවුරුදු 16-22 අතර තරුණ වරදකරුවන් රඳවා තබා ගනියි. දෛනික කාලසටහනක් ඇත. පවුරු නැත. විවෘතව අමුත්තන් බැලීම සඳහා අවස්ථාව ඇත. අධ්‍යාපන වැඩසටහන්, පුනරුත්ථාපන/ උපදේශන හා පුහුණු වැඩසටහන් ඇත. අවම ආරක්ෂාවක් යොදවයි.

(උ) සිර මැදිරි :-

උසාවි ඉදිරිපත් කිරීම තෙක් තාවකාලිකව රඳවන ආයතන වේ. ජ්‍යෙෂ්ඨ සැරයන්වරයෙකු ආයතන බාර නිලධාරියා වේ. ප්‍රධාන බන්ධනාගාරයක් මගින් පාලනය වේ. එක බන්ධනාගාරයකට සිරමැදිරි කිහිපයක් තිබිය හැක.

### 2.1.4. දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා කටයුතු කරන අතර, ඔහු යටතේ අතිරේක බන්ධනාගාර කොමසාරිස්වරයෙකු කටයුතු කරයි. එම තනතුරු යටතේ උප දෙපාර්තමේන්තු දහයක් ක්‍රියාත්මක වේ. එම උප දෙපාර්තමේන්තුවල කාර්යයන් හා පිහිටීම අනුව අංශ ගණනාවක් යටතේ කාර්යමණ්ඩලය වෙන්කර දක්වා ඇත.

### 2.1.5. කාර්යමණ්ඩල තොරතුරු (2022 දෙසැම්බර් 31 දිනට )

2022 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය අනුව විවිධ වර්ගීකරණ යටතේ තනතුරු 85 ක් වෙනුවෙන් අනුමත නිලධාරීන් සංඛ්‍යාව 7,872 ක් වූ අතර එම තනතුරුවලට අනුයුක්තව සේවය කරනු ලබන නිලධාරීන් සංඛ්‍යාව 6,268 ක් විය. උපලේඛන 01 හි දැක්වේ.

## 2.2. විගණනය සඳහා අධිකාර බලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව හා 2018 අංක 19 දරණ විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 2.3. විගණන ප්‍රවේශය

බන්ධනාගාර ධාරිතාවය ඉක්මවා යන පරිදි බන්ධනාගාර තුළ රැඳවියන් සංඛ්‍යාව වැඩි වීම තුළින් රැඳවියන් තබාගත හැකි ඉඩකඩ ප්‍රමාණය අඩු වීම නිසා බන්ධනාගාර තදබදය නිර්මාණය වේ. පසුගිය වර්ෂ 08 කට ආසන්න කාලපරිච්ඡේදයට අදාළව දත්ත සලකා බැලීමේ දී බන්ධනාගාරගත රැඳවියන් සංඛ්‍යාව, බන්ධනාගාර ධාරිතාවය ඉක්මවා ගොස් ඇත. නමුත් 2020 වර්ෂයෙන් පසු බන්ධනාගාර ගොඩනැගිලි ඉදිකිරිම හේතුවෙන් 2020 වර්ෂයේ දී යම් ප්‍රමාණයකින් බන්ධනාගාර තදබදය අඩු වුවද 2022 වර්ෂයේදී බන්ධනාගාර තදබදය පෙර කාලපරිච්ඡේද වලට වඩා වැඩි වී ඇති අතර එය තවදුරටත් එම වර්ෂයන්හි දෙසැම්බර් 31 දිනට සිටින රැඳවියන් සංඛ්‍යාව අනුව 2022 වර්ෂයේ 2021 වර්ෂයට සාපේක්ෂව බන්ධනාගාර ධාරිතාවය ඉක්මවා රඳවා ඇති රැඳවියන් සංඛ්‍යාව සියයට 190 කින් වැඩි වී ඇත.



අප රටේ වර්ථමාන ආර්ථික තත්ත්වය හමුවේ මතුවී ඇති සමාජ ආර්ථික ප්‍රශ්න හේතුකොට ගෙන හා මත්ද්‍රව්‍යවලට පුද්ගලයන් ඇබ්බැහි වීම නිසා බන්ධනාගාරගත රැඳවියන් සංඛ්‍යාව විශාල වශයෙන් ඉහළ ගොස් ඇත. බන්ධනාගාර තදබදය අවම කිරීම සඳහා බොරැල්ලේ පිහිටි වැලිකඩ බන්ධනාගාර සංකීර්ණය හොරණ මිල්ලෑව ප්‍රදේශයේ ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියක් දැනට සැලසුම් කර ඇත. රටේ පවතින ආර්ථික අර්බුද හමුවේ නව ඉදිකිරීම් නවතා ඇති නිසා මෙම ව්‍යාපෘතියද ක්‍රියාත්මක කිරීම තාවකාලිකව නවතා ඇත. මෙවැනි තත්ත්වයක් තුළ බන්ධනාගාර තදබදය තුළින් පෙරටත් වඩා ගැටළු රාශියකට බන්ධනාගාර පද්ධතිය වර්ථමානයේ මුහුණ දී ඇත. එවැනි පසුබිමක් තුළ මෙම ගැටළු සාකච්ඡා කිරීම තුළින් එම ගැටළුවලට හේතු, ඊට වගකිවයුතු පාර්ශවයන් හඳුනාගැනීම සඳහා ගැටළු ප්‍රවේශය යටතේ මෙම කාර්යය සාධන විගණනය සිදු කිරීම.

## 2.4. විගණන අරමුණ හා නිර්ණායක

ශ්‍රී ලංකාවේ බන්ධනාගාර පද්ධතිය තුළ පවතින තදබදය හා එයට හේතු හඳුනාගැනීමත්, එම හේතු නිසා ඇතිවන ගැටළු හඳුනාගෙන ඒ සඳහා නිර්දේශ ලබා දීමත් මෙම විගණනයේ අරමුණ වේ.

| නිර්ණායක | මූලාශ්‍ර |
|---|---|
| (අ) (i.) එක් සිරකරුවෙකු රැඳවිය යුතු සිර මැදිරියක මතුපිට වර්ග ප්‍රමාණය වර්ග අඩි 54 කට නොඅඩු හෝ ඝණ අඩි 540 කට නොඅඩු විය යුතු වීම. (දිග අඩි 9 x පළල අඩි 6 x උස අඩි 10) | • 1877 අංක 16 දරන බන්ධනාගාර ආඥාපනත හා සංශෝධනයන් හි 179 රීති<br>• 2013 පෙබරවාරි 26 දිනැති අංක 11/2013 දරණ බන්ධනාගාර කොමසාරිස් ජනරාල් චක්‍රලේඛය<br>• එක්සත් ජාතීන්ගේ ව්‍යාපෘති සේවාවන් සඳහා වන කාර්යාලය (United Nations Office For Project Services - UNOPS ) හි බන්ධනාගාර සැලසුම් කිරීම සඳහා වන තාක්ෂණික මාර්ගෝපදේශයෙ හි (Technical Guidance For Prison Planning) සඳහන් අවම ප්‍රමිතීන් |
| (ii.) සෑම බන්ධනාගාර ශාලාවකම (වාට්ටු) එක් රැඳවියෙකු සඳහා තිබිය යුතු අඩි ප්‍රමාණය 24 ක් හා එම ගොඩනැගිල්ල අවම වශයෙන් උස අඩි 10 ක් විය යුතු වීම. (දිග අඩි 8 x පළල අඩි 3 x උස අඩි 10) | • 2013 පෙබරවාරි 26 දිනැති අංක 11/2013 දරණ බන්ධනාගාර කොමසාරිස් ජනරාල් චක්‍රලේඛය |
| (iii.) රැඳවියන් වර්ගීකරණය කිරීම | • 1877 අංක 16 දරන බන්ධනාගාර ආඥාපනත හා සංශෝධනයන් හි 178 රීති |

| | | |
|---|---|---|
| (ආ) | අවුරුදු 02 කට වඩා අඩු (අනිවාර්යය නොවන) සිර දඬුවම් සඳහා අධිකරණය මඟින් බන්ධනාගාර ගත කිරීමේ දඬුවමක්, අත්හිටවන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් හෝ දඩයක් නියම කිරීම වෙනුවට විකල්ප දඬුවමක් ලෙස ප්‍රජා පාදක විශෝධන ආඥාවක් නිකුත් කිරීම හා ආඥා ක්‍රියාත්මක කිරීම. | • 1999 අංක 46 දරන ප්‍රජා පාදක විශෝධන පනත |
| (ඇ) | රජයේ රසපරීක්ෂක විසින් ඔහු වෙත ඉදිරිපත් කරන ඖෂධ, ද්‍රව්‍ය, භාණ්ඩ හෝ සැකසුමක් පිළිබඳ පරීක්ෂණ සිදු කර ඉදිරිපත් කරන ලද දින සිට මාස 12 ක් නොයික්ම වන කාලසීමාවක් තුළ ඔහුගේ පරීක්ෂණ ප්‍රතිඵල වාර්තාව පොලිස් නිලධරයාට හෝ පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය වෙත පිටපත් සහිතව නිසි අධිකරණයක් වෙත ඉදිරිපත් කිරීම. | • 2022 අංක 41 දරණ විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග සංශෝධන පනත (1984 අංක 13 දරන විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග පනත) |
| (ඈ) | අන්තරාදායක ඖෂධ සඳහා තැනැත්තෙකු ඇබ්බැහි වී ඇත්ද යන්න සම්බන්ධයෙන් වෛද්‍ය වාර්ථා කැඳවීම අදාළ පුද්ගලයන් මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කිරීම ස්ථාන භාර පොලිස් නිලධාරී වෙත පැවරීම. | • 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත |
| (ඉ) | සිරකරුවන් තාවකාලිකව නිවාස නිවාඩු යැවීමේ ක්‍රමවේදය | • අපරාධ වැළැක්වීමේ ආඥා පනත 11 වන වගන්තිය |
| (ඊ) | ජනාධිපතිවරයා විසින් සිරකරුවන් සඳහා රාජ්‍ය සමාව ප්‍රදානය | • ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වන වගන්තිය |

| | | |
|---|---|---|
| (උ) | සිරකරුවන්ට මානව ගරුත්වයෙන් යුතුව සැලකීමක් ලෙස අපරාධ චෝදනා ලැබූවන් සාධාරණ කාලයක් තුළ නඩු විභාග කර අවසන් කළ යුතු වීම | • එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල විසින් ඉදිරිපත් කර ඇති සිරගත පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා වූ මූලධර්ම (1988) හි 38 වන මූලධර්මය<br>• මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයේ 11 වන වගන්තිය |
| (ඌ) | සිරකරු ශ්‍රමය පෞද්ගලික අංශයේ ව්‍යාපෘතිවල යෙදවීමේ දී අදාළ ක්ෂේත්‍රයේ මාස 3ක පුහුණුවක්, වෘත්තීය මට්ටමේ සහතිකයක් හා විදේශ රැකියා සඳහා විදේශ භාෂා පුහුණුවක් ලබා දිය යුතු වීම | • 2020 මැයි 14 දිනැති අංක 20/0792/207/025 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව |

## 2.5. විගණන ක්‍රමවේදය

පහත සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කරමින් මෙම පරීක්ෂණය සිදු කරන ලදි.

(i.) පවතින නීතිරීති රෙගුලාසි, ප්‍රමිතීන් පිළිබඳ අධ්‍යයනය

(ii.) සම්මුඛ සාකච්ඡා මඟින් අවශ්‍ය අවබෝධය හා තොරතුරු ලබාගැනීම.

(iii.) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන, කාර්යසාධන හා සංඛ්‍යාලේඛන වාර්තාවල ඇතුළත් ලිඛිත තොරතුරු හා වෙනත් ලිඛිත තොරතුරු කැඳවීම

(iv.) භෞතික පරීක්ෂාවන්

(v.) රූපවාහිණී, ගුවන් විදුලි හා පුවත්පත් වැනි මාධ්‍ය තුළින් නිතර කෙරෙන අනාවරණයන්හි ඇතුළත් අවධානය යොමුවිය යුතු කරුණු හඳුනා ගැනීම. පසුගිය කාලය තුළ එවැනි මාධ්‍ය ආනාවරණයන් කිහිපයක් පිළිබඳ විස්තර පහත පරිදි විය.

## 2.6. විෂය පථය හා විෂය පථයේ සීමාවන්

### 2.6.1. විෂය පථය

බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ පවතින ආරක්ෂිත බන්ධනාගාර 04 ක්, රිමාන්ඩ් බන්ධනාගාර 18 ක්, තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථාන 02ක්, වැඩ කඳවුරු 10ක්, විවෘත වැඩ කඳවුරු 02ක්, සිර මැදිරි 23ක් සහ බන්ධනාගාර පාසලක 2022 ජනවාරි සිට දෙසැම්බර් 31 දින දක්වා රඳවා තිබූ රැඳවියන්ගේ තොරතුරු මත බන්ධනාගාර තදබදය සම්බන්ධව පරීක්ෂා කරන ලදි. මීට අමතරව අවුරුදු 02 කට වඩා අඩු සිර දඬුවම් සඳහා අධිකරණය මඟින් බන්ධනාගාර ගත කිරීමේ දඬුවමක්, අත්හිටුවන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් හෝ දඩයක් නියම කිරීම වෙනුවට විකල්ප දඬුවමක් ලෙස ප්‍රජා පාදක විශෝධන ආඥාවන් නිකුත් කරනු ලැබූ ආඥාලාභීන් පිළිබඳ තොරතුරු මෙම විගණනය සඳහා පාදක කරගන්නා ලදි.

### 2.6.2. විෂය පථය සීමාවන්

පහත සඳහන් පරිදි විගණන සාක්ෂි ලබා ගැනීමේ සීමාවන් පැවතුණි.

(i.) බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතු ප්‍රාථමික දත්ත උපයෝගී කරගෙන තොරතුරු සකස් කිරීම

(ii.) කාලය සීමා සහිත වීම නිසා භෞතික පරීක්ෂා කිරීමේ දී නියැදි පරීක්ෂණ සඳහා යොමු වීම

(iii.) අධිකරණය වැනි බාහිර ආයතනවලින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට නොහැකි විම.

(iv.) බන්ධනාගාර පරිශ්‍රයන් හා රැඳවියන් වෙත ඍජුව ප්‍රවේශ වී  රැඳවියන්ගෙන් ඍජුව අදහස් විමසීම තුළින් තොරතුරු ලබා ගැනීමට ඇති හැකියාව අවම මට්ටමක පැවතීම.

(v.) ඡායා රූප ගැනීම් මඟින් තොරතුරු රැස් කිරීමේදී විගණනය විසින් ඍජුවම සිදු නොකිරීම.

(vi.) නැවත නැවත සිරගතවන රැඳවියන් සම්බන්ධව විධිමත්ව තොරතුරු රැස්කිරීමක් බන්ධනාගාර විසින් සිදු කර නොතිබීම

(vii.) වර්තමාන තත්ත්වයන් පිළිබඳ දත්ත ලබා ගැනීමේ දී සැලකිය යුතු කාල ප්‍රමාදයන් පැවතීම

(viii.) අවිධිමත්ව සනාථ කල ඇතැම් කරුණු සඳහා විධිමත්ව සනාථ කිරීමට සාක්ෂි ලබා ගත නොහැකි වීම.

(ix.) පවතින ආර්ථික අර්බුද හමුවේ විගණනය විසින් අවශ්‍ය සම්පත් අවම වශයෙන් භාවිතා කිරීම

(x.) දෛනිකව බන්ධනාගාරගත වී සිටින රැඳවියන් සංඛ්‍යාව ප්‍රකාශ කිරීම සඳහා කිසියම් වර්ෂයක් තුළ සිටි රැඳවියන් සංඛ්‍යාවේ මධ්‍යන අගය කේන්ද්‍රික ප්‍රවණතා මිනුමක් වශයෙන් භාවිතා කළ හැකි වුවද 2022 වර්ෂයේ දෛනික මධ්‍යන අගය ගණනය කර නොතිබීම හෙයින් 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බන්ධනාගාරගත රැඳවියන් සංඛ්‍යාව ඒ සඳහා යොදා ගැනීමට සිදු විය. ඒ අනුව පෙර වර්ෂවලද තොරතුරු සංසන්දනයේ දී සංගතතාවය ආරක්ෂා කිරීම සඳහා ඒ ඒ වර්ෂවල දෙසැම්බර් 31 දිනට බන්ධනාගාරගත රැඳවියන් ප්‍රමාණය යොදාගෙන ඇත.

## 3. විස්තරාත්මක විගණන නිරීක්ෂණ

### 3.1. බන්ධනාගාර ධාරිතාවය

බන්ධනාගාර ධාරිතාවය යනුවෙන් අදහස් කරන්නේ ජාතික නීති පද්ධතියේ හෝ රෙගුලාසි හෝ වෙනත් මාර්ගෝපදේශ ලේඛනයක් පදනම් කරගත් ප්‍රමිතීන්ට අනුකූලව යම් බන්ධනාගාරයක නේවාසික පහසුකම් සැපයිය හැකි රැඳවියන් ප්‍රමාණයයි.

#### 3.1.1. ඉඩපහසුකම් සම්බන්ධ සම්මත ප්‍රමිතීන්

ශ්‍රී ලංකාවේ බන්ධනාගාරගත රැඳවියන් සඳහා ලබා දිය යුතු සම්මත ඉඩකඩ ප්‍රමාණය තීරණය කිරීමේ දී පහත සඳහන් ප්‍රමිත තත්ත්වයන් සැලකිල්ලට ගන්නා ලදි.

(අ) 1956 වර්ෂයේදී සංශෝධනයට ලක්කරන ලද බන්ධනාගාර ආඥා පනතේ 54 වන ඡේදය ප්‍රකාරව බන්ධනාගාරයේ තිබෙන සිර මැදිරිවල ප්‍රමාණ අනුව සෑම පිරිමි සිරකරුවෙකු රාත්‍රී කාලයේදී වෙනම මැදිරියක ඉබි යතුරු දමා රඳවා ගත යුතුවේ. එවැනි එක් සිරකරුවෙකු රැඳවිය යුතු සිර මැදිරියක මතුපිට වර්ග ප්‍රමාණය වර්ග අඩි 54 කට නොඅඩු හෝ ඝණ අඩි 540 කට නොඅඩු විය යුතු බව (දිග අඩි 9, පළල අඩි 6, උස අඩි 10 ක් විය යුතු බව) සඳහන් වේ.

(ආ) බන්ධනාගාර කොමසාරිස් ජනරාල් චක්‍රලේඛ අංක 11/2013 හා 2013.02.26 දිනැති චක්‍රලේඛයට අනුව, සෑම බන්ධනාගාර ශාලාවකම (වාට්ටු) එක් රැඳවියෙකු සඳහා තිබිය යුතු අඩි ප්‍රමාණය 24 ක් (දිග අඩි 08 x පළල අඩි 03) හා එම ගොඩනැගිල්ල අවම වශයෙන් උස අඩි 10 ක් විය යුතුය.

(ඇ) මීට අමතරව එක්සත් ජාතීන්ගේ ව්‍යාපෘති සේවාවන් සඳහා වන කාර්යාලය (United Nations Office For Project Services - UNOPS ) හි බන්ධනාගාර සැලසුම් කිරීම සඳහා වන තාක්ෂණික මාර්ගෝපදේශයෙ හි (Technical Guidance For Prison Planning) සඳහන් පරිදි සිර මැදිරියක හා ශාලාවක සිරකරුවෙකු සඳහා අවම ප්‍රමිතීන් වන පොළවේ මතුපිට ඉඩකඩ හා වාතාශ්‍රය, ආලෝකය ලැබීම සඳහා පැවතිය යුතු ඉඩකඩ වෙන් වෙන්ව දක්වා ඇත. ඒ අනුව සිරමැදිරියක එක් සිරකරුවෙකු සඳහා වර්ග මීටර් 5.4 ක් ද, එක් අයෙකුට වැඩියෙන් රඳවන අවස්ථාවක එක් සිරකරුවෙක් සඳහා වර්ග මීටර් 3.4 ක ඉඩකඩක්ද පැවතිය යුතු බව සඳහන් වන අතර සිර වාට්ටු වල නැත හොත් ශාලාවක එක් අයෙකු සඳහා තනි ඇඳක් සහිතව වර්ග මීටර් 3.4 ක්ද, තට්ටු ඇඳන් 02 ක් සහිතව එක් අයෙකු සඳහා වර්ග මීටර් 2.6 ක ඉඩකඩක්ද, තට්ටු ඇඳන් 03 ක් සහිතව එක් අයෙකු සඳහා වර්ග මීටර් 2.3 ක් පැවතිය යුතු බව සඳහන් වේ.

### 3.1.2. බන්ධනාගාර තුල පවතින තදබදය

බන්ධනාගාර ධාරිතාවය ඉක්මවා යන පරිදි බන්ධනාගාර තුළ රැඳවියන් සංඛ්‍යාව වැඩි වීම හේතුවෙන් රැඳවියන් තබාගත හැකි ඉඩකඩ ප්‍රමාණය අඩු වීම නිසා බන්ධනාගාර තදබදය නිර්මාණය වන අතර ඒ සම්බන්ධ අදාළ නිරීක්ෂණ ඉදිරි ඡේදයන් හි දැක්වේ.

### 3.1.3. බන්ධනාගාර තදබදය පිළිබඳ සමස්ථ තත්ත්වය

මේ සම්බන්ධ නිරීක්ෂණ පහත පරිදි විය.


(අ) 2015 වර්ෂයේ දෙසැම්බර් 31 දිනසිට 2022 දෙසැම්බර් 31දින දක්වා පසුගිය වර්ෂ 07 ක කාලපරිච්ඡේදය තුළ එක් එක් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දත්ත සලකා බැලීමේ දී ශ්‍රී ලංකාවේ සමස්ථ බන්ධනාගාර පද්ධතිය තුළ බන්ධනාගාරගත රැඳවියන් සංඛ්‍යාව, බන්ධනාගාරවල ධාරිතාවය මෙන් සියයට 139 සිට සියයට 232 අතර පරාසයක විය. මෙම ප්‍රතිශතය 2016 වර්ෂයේ මුල සිට 2019 වර්ෂයේ අවසානය දක්වා සියයට 149 සිට සියයට 213 දක්වා ඉහළ ගොස් ඇත. 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එය සියයට 139 ක් දක්වා පහත වැටුණි. එයට හේතුව වූයේ 2020 වර්ෂය අවසන් වන විට බන්ධනාගාර ධාරිතාවය 11,762 සිට 13,241ක දක්වා එනම් සියයට 12.5කින් වර්ධනය වීමයි. බන්ධනාගාර ධාරිතාවය මෙසේ වර්ධනය වුවද බන්ධනාගාර ගත වන රැඳවියන් සංඛ්‍යාව වැඩි වීම නිසා වර්ථමානයේ මෙය සියයට 232 දක්වා ඉහළ ගොස් ඇත. 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර ධාරිතාවය ඉක්මවා බන්ධනාගාර පද්ධතිය තුළ රඳවා සිටි රැඳවියන් සංඛ්‍යාව 14,885 ක් විය.

2015 දෙසැම්බර් 31 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ බන්ධනාගාර ධාරිතාවය ඉක්මවා රඳවා සිට රැඳවියන් ප්‍රමාණය

| වර්ෂය (දෙසැම්බර් 31 දින වන විට) | බන්ධනාගාර ධාරිතාවය (රැඳවියන් සංඛ්‍යාව) | බන්ධනාගාරය තුළ නේවාසිකව රඳවා සිටි රැඳවියන් සංඛ්‍යාව | බන්ධනාගාර ධාරිතාවය ඉක්මවා නේවාසිකව රඳවා සිටි රැඳවියන් සංඛ්‍යාව | රඳවා සිටින රැඳවියන් සංඛ්‍යාව බන්ධනාගාර ධාරිතාවයේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---:|---:|---:|---:|
| 2015 දෙසැම්බර් 31 | 11,762 | 17,212 | 5,450 | 146 |
| 2016 දෙසැම්බර් 31 | 11,762 | 17,482 | 5,720 | 149 |
| 2017 දෙසැම්බර් 31 | 11,762 | 19,712 | 7,950 | 168 |
| 2018 දෙසැම්බර් 31 | 11,762 | 23,364 | 11,602 | 199 |
| 2019 දෙසැම්බර් 31 | 11,762 | 25,108 | 13,346 | 213 |
| 2020 දෙසැම්බර් 31 | 13,241 | 19,399 | 6,158 | 147 |
| 2021 දෙසැම්බර් 31 | 13,241 | 18,373 | 5,132 | 139 |
| 2022 දෙසැම්බර් 31 | 11,291 | 26,176 | 14,885 | 232 |

*(මූලාශ්‍රය - බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අංශය)*

2015 දෙසැම්බර් 31 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ බන්ධනාගාර ධාරිතාවය ඉක්මවා රඳවා සිට රැඳවියන් ප්‍රමාණය



(ආ) ශ්‍රී ලංකාවේ බන්ධනාගාරවල අවම ප්‍රමිතීන්ට අනුව රැඳවියන් සඳහා ප්‍රමාණවත් ඉඩපහසුකම් නොතිබීම නිසා බන්ධනාගාරවල අධික තදබදයක් පවතින බවට සනාථවන කරුනු විගණනයට ඉදිරිපත් විය. විගණනය විසින් සිදු කරන ලද නියැදි භෞතික පරීක්ෂාවේ දී බන්ධනාගාර තුළ අධික තදබදයක් නිරීක්ෂණය වූ අතර එම භෞතික පරීක්ෂාවන් හිදි කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ E හා H වාට්ටුවල සහ මහර බන්ධනාගාරයේ P වාට්ටුවේ පැවති සිරකරු තදබදය පහත ඡායා රූපවලින් නිරූපනය වේ.


කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය
**2023.01.25 දින**
**E වාට්ටුව**


කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය
**2023.01.25 දින**
**H වාට්ටුව**


මහර බන්ධනාගාරය
**2022.12.12 දින**
**P වාට්ටුව**


මහර බන්ධනාගාරය
**2022.12.12 දින**
**P වාට්ටුව**

### 3.1.4. 2022 වර්ෂයේ රැඳවියන් අසාමන්‍ය ලෙස වර්ධනය වීම.


තවදුරටත් 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ බන්ධනාගාර ධාරිතාවය ඉක්මවා රඳවා ඇති රැඳවියන් සංඛ්‍යාව වර්ධනය වී ඇත. ඒ අනුව 2022 වර්ෂයේ මාස 12 තුළ රඳවා ඇති සාමාන්‍ය මාසික රැඳවියන් සංඛ්‍යාව 22,097 වන අතර එය 2021 වර්ෂයේ සාමාන්‍ය මාසික රැඳවියන් සංඛ්‍යාව වන 19,295 ට සාපේක්ෂව සියයට 15 කින් වර්ධනය වී ඇත.

2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ එක් එක් මාසයේ බන්ධනාගාරගත රැඳවියන් සංඛ්‍යාව වැඩි වී ඇත ප්‍රමාණය.

| මාසය | 2021 වර්ෂය | | | 2022 වර්ෂය | | |
|---|---|---|---|---|---|---|
| | සිරකරුවන් සංඛ්‍යාව | සැකකරුවන් සංඛ්‍යාව | එකතුව | සිරකරුවන් සංඛ්‍යාව | සැකකරුවන් සංඛ්‍යාව | එකතුව |
| ------------- | ---------- | ----------- | -------- | ----------- | ----------- | -------- |
| ජනවාරි | 6,612 | 11,894 | 18,506 | 7,512 | 11,360 | 18,872 |
| පෙබරවාරි | 6,661 | 11,835 | 18,496 | 7,666 | 11,866 | 19,532 |
| මාර්තු | 7,369 | 11,884 | 19,253 | 8,134 | 12,122 | 20,256 |
| අප්‍රේල් | 7,474 | 12,916 | 20,390 | 8,037 | 11,637 | 19,674 |
| මැයි | 6,813 | 12,481 | 19,294 | 7,485 | 12,148 | 19,633 |
| ජුනි | 6,496 | 12,511 | 19,007 | 7,603 | 12,194 | 19,797 |
| ජූලි | 6,882 | 13,141 | 20,023 | 7,789 | 12,796 | 20,585 |
| අගෝස්තු | 6,786 | 12,923 | 19,709 | 8,506 | 14,870 | 23.376 |
| සැප්තැම්බර් | 6,821 | 12,938 | 19,759 | 9,002 | 15,651 | 24,653 |
| ඔක්තෝම්බර් | 7,160 | 12,585 | 19,745 | 9,405 | 16,590 | 25,995 |
| නොවැම්බර් | 7,201 | 11,788 | 18,989 | 10,155 | 16,459 | 26,614 |
| දෙසැම්බර් | 7,356 | 11,017 | 18,373 | 9,449 | 16,727 | 26,176 |

(මූලාශ්‍රය - බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අංශය)

2021 වර්ෂයට සාපේෂව 2022 වර්ෂයේ එක් එක් මාසය තුළ බන්ධනාගාරගත රැඳවියන් ප්‍රමාණය




ඒ අනුව බන්ධනාගාර තුළ පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොවන තත්ත්වයක් තුළ මෙසේ අසාමාන්‍ය ලෙස රැඳවියන් වර්ධනය වීම නිසා එය කළමනාකරණය කර ගැනීමට ද බාධාවක් වේ.

### 3.1.5. බන්ධනාගාර ආයතනවල ධාරිතාවය ඉක්මවා රැඳවියන් රඳවා තිබීම

බන්ධනාගාර පද්ධතිය තුළ එක් එක් බන්ධනාගාර ආයතනවල බන්ධනාගාර ධාරිතාවය ඉක්මවා රැඳවියන් රඳවා ඇති අතර 2022 දෙසැම්බර් 31 දින වන විට එක් එක් බන්ධනාගාර ආයතන 27 සංඛ්‍යාත්මක තොරතුරු අනුව ධාරිතාවය ඉක්මවූ රැඳවියන් සංඛ්‍යාව 14,124 ක් වන අතර, එය 62 සිට 1,907 ක් අතර පරාසයක පවතී. විස්තර පහත වගුවේ දැක්වේ.

| බන්ධනාගාර ආයතනය | බන්ධනාගාර ධාරිතාව | රඳවා ඇති රැඳවියන් ප්‍රමාණය | ධාරිතාවය ඉක්මවා රඳවා ඇති රැඳවියන් ප්‍රමාණය |
|---|---|---|---|
| වැලිකඩ | 1,422 | 2,490 | 1,068 |
| කො.රි.බ | 423 | 1,676 | 1,253 |
| මැගසින් | 493 | 1,282 | 789 |
| මහර | 1,000 | 2,907 | 1,907 |
| බෝගම්බර | 1,006 | 1,884 | 878 |
| අගුණුකොළපැලැස්ස | 952 | 1,557 | 605 |
| අනුරාධපුරය | 830 | 902 | 72 |
| ත්‍රිකුණාමලය | 121 | 330 | 209 |
| කළුතර | 559 | 1,328 | 769 |
| කුරුවිට | 624 | 753 | 129 |
| මඩකලපුව | 197 | 621 | 424 |
| බදුල්ල | 157 | 356 | 199 |
| ගාල්ල | 120 | 998 | 878 |
| මාතර | 146 | 488 | 342 |
| මීගමුව | 761 | 1,832 | 1,071 |
| වවුනියාව | 54 | 336 | 282 |
| කෑගල්ල | 149 | 705 | 556 |
| අඹේපුස්ස | 70 | 153 | 83 |
| වාරියපොල | 182 | 912 | 730 |
| යාපනය | 336 | 714 | 378 |
| පොළොන්නරුව | 252 | 314 | 62 |
| මොණරාගල | 114 | 219 | 105 |
| පල්ලේකැලේ | 287 | 852 | 565 |
| හෝමාගම | 108 | 248 | 140 |
| වීරවිල | 278 | 476 | 198 |
| පල්ලන්සේන | 170 | 357 | 187 |
| තල්දෙන | 155 | 400 | 245 |
| | | | 14,124 |

(මූලාශ්‍රය - බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අංශය)

### 3.1.6. රැඳවියන් සඳහා අවශ්‍ය ප්‍රමාණවත් ඉඩකඩ නොතිබීම.

පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට හා පවතින නීතිමය තත්ත්වයන්ට අනුකූල වන පරිදි රැඳවියන්ගේ මානසික හා ශාරීරික යෝග්‍යතාවයන්ට ගැලපෙන ආකාරයන්ට ඉඩ පහසුකම් සහිතව රැඳවියන් සඳහා නේවාසික පහසුකම් සැපයීම බන්ධනාගාර තදබදය නිසා අපහසු වී ඇත. 2022 ජූලි 01 දිනට මීගමුව හා වවුනියාව බන්ධනාගාර වල සිරකුටි හා වට්ටුවල ගැහැණු රැඳවියන් සඳහා ඌන ඉඩකඩ ප්‍රමාණය වර්ග අඩි පිළිවෙලින් 240ක් හා 141ක් වේ. මීට අමතරව බන්ධනාගාර 14 ක පිරිමි රැඳවියන් සඳහා වර්ග අඩි 108,689 ක ඌන ඉඩකඩ ප්‍රමාණයක් පවතින බව විගණනයට අනාවරණය විය.

2022 ජූලි 01 දිනට බන්ධනාගාර පද්ධතියේ පිරිමි රැඳවියන්ගේ ඌන ඉඩකඩ ප්‍රමාණය

| අනු අංක | බන්ධනාගාර ආයතනය | රඳවා ඇති රැඳවියන් සංඛ්‍යාව | තිබිය යුතු ඉඩකඩ ප්‍රමාණය (වර්ග අඩි) | තිබෙන ඉඩකඩ ප්‍රමාණය (වර්ග අඩි) | ඌන ඉඩකඩ අවශ්‍යතාවය (වර්ග අඩි) |
|---|---|---|---|---|---|
| 1. | වැලිකඩ | 2,103 | 103,948 | 76,540 | 27,408 |
| 2. | නව මැගසින් | 844 | 21,891 | 19,203 | 2,688 |
| 3. | බෝගම්බර | 1,334 | 32,466 | 21,853 | 12,463 |
| 4. | අනුරාධපුර | 738 | 23,517 | 11,799 | 11,718 |
| 5. | මීගමුව | 1,383 | 33,549 | 18,645 | 14,904 |
| 6. | ගාල්ල | 611 | 10,998 | 9,459 | 1,539 |
| 7. | මාතර | 372 | 6,696 | 6,243 | 378 |
| 8. | මඩකලපුව | 475 | 11,400 | 7,665 | 3,744 |
| 9. | කෑගල්ල | 628 | 15,072 | 5,621 | 9,451 |
| 10. | ත්‍රිකුණාමලය | 226 | 5,424 | 4,368 | 1,056 |
| 11. | යාපනය | 545 | 11,649 | 8,049 | 3,600 |
| 12. | පොළොන්නරුව | 706 | 18,604 | 4,672 | 14,012 |
| 13. | වවුනියාව | 257 | 5,784 | 1,640 | 4,144 |
| 14. | අඹේපුස්ස | 171 | 4,104 | 2,520 | 1,584 |
| | | | | | 108,689 |

(මූලාශ්‍රය - ඉහත වගුවේ සඳහන් ඒ ඒ බන්ධනාගාර ආයතවලින් ලබාගත් තොරතුරු)

### 3.1.7. සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත් නොමැතිවීම

බන්ධනාගාර ධාරිතාවය ඉක්මවා රැඳවියන් ප්‍රමාණය වැඩිවෙත්ම රැඳවියන් හට ප්‍රමාණවත් පරිදි සනීපාරක්ෂක පහසුකම් ලබා දීම දුෂ්කර වේ. 2023 අප්‍රේල් 30 දින වන විට බන්ධනාගාර 27 ක වැසිකිළි 187 ක හිඟයක් පැවති අතර, දැනට තිබෙන වැසිකිළිවලින් ද 287 ක් අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතුණි. විස්තර පහත දැක්වේ.

| බන්ධනාගාරය | අළුත්වැඩියා කල යුතු වැසිකිලි සංඛ්‍යාව | තවදුරටත් අවශ්‍ය වැසිකිළි සංඛ්‍යාව |
|---|---|---|
| දළුපත | 03 | 0 |
| මඩකලපුව | 10 | 0 |
| කුරුවිට | 02 | 10 |
| කෑගල්ල | 06 | 04 |
| ගාල්ල | 03 | 15 |
| කළුතර | 18 | 02 |
| කොළඹ රිමාන්ඩ් | 27 | 11 |
| නව මැගසින් | 21 | 05 |
| වැලිකඩ | 15 | 03 |
| වව්නියාව | 0 | 06 |
| යාපනය | 06 | 09 |
| අනුරාධපුරය | 26 | 02 |
| අඟ්ඹපුස්ස | 01 | 0 |
| අගුණකොළපැලැස්ස | 70 | 0 |
| පොළොන්නරුව | 04 | 02 |
| මීගමුව | 0 | 51 |
| මහර | 08 | 48 |
| පල්ලෙකැලේ | 19 | 08 |
| බෝගම්බර | 05 | 0 |
| වාරියපොල | 06 | 2 |
| මාතර | 03 | 01 |
| ත්‍රිකුණාමලය | 04 | 0 |
| මොණරාගල | 04 | 0 |
| බදුල්ල | 07 | 0 |
| වීරවිල | 04 | 0 |
| වටරැක | 02 | 03 |
| තල්දෙන | 04 | 05 |
| | 278 | 187 |

(මූලාශ්‍රය - ඉහත වගුවේ සඳහන් ඒ ඒ බන්ධනාගාර ආයතවලින් ලබාගත් තොරතුරු)

## 3.2. බන්ධනාගාර තදබදය ඇතිවීමට හේතු

බන්ධනාගාර තදබදය ඇතිවීමට හේතු ක්ෂේත්‍ර දෙකක් යටතේ හඳුනාගත හැක.

### 3.2.1. ආර්ථික, සමාජීය, දේශපාලන හා නීතිමය පරිසරයේ බලපෑම

රටක ආර්ථික, සමාජීය, දේශපාලන හා නීතිමය පරිසරය තුළින් මතුවන ගැටළු හේතුවෙන් අපරාධ ක්‍රියාකාරකම් වැඩි වීමේ සෘජු ප්‍රතිඵලයක් ලෙස සිරගත කිරීම් ඉහළ යාම නිසා බන්ධනාගාරවල තදබදය ඇතිවීමට හේතු වේ. එනම් දරිද්‍රතාවයෙන් පෙළෙන, නූගත් හෝ සීමිත අධ්‍යාපනයක් ලැබූ, විරැකියාව සහ නිවාස නොමැති සමාජයේ කොටස්වල ඔවුන්ගේ පවුල් ආර්ථිකය බිඳවැටීම, මත්ද්‍රව්‍ය හා අනිසි මත්පැන් භාවිතය, සමාජ ආර්ථික පරිසරයන් තුළ ඇතිවන ක්‍රියාකාරකම්වලින් විනාශකාරී ප්‍රතිවිපාකයන්ට මුහුණ දීමට සිදු වීම නිසා සමාජයේ පුද්ගලයින් වැරදි කිරීමට පෙළඹීම තුළින් අපරාධ ක්‍රියාකාරකම් වැඩිවිය හැක. යුක්තිය ලබා ගැනීමට ඇති බාධා හා ප්‍රමාදයන් එනම් සියලු දෙනාට යුක්තිය සඳහා සමාන ප්‍රවේශයක්

සහතික කිරීම හා ජාත්‍යාන්තර සම්මුතීන් මගින් පනවා ඇති අවම වගකීම් සහ ප්‍රමිතීන් ලබා දීමට නොහැකි වන තත්ත්වයක් තුළ අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම්, නඩු විභාගයන්ට පෙර දීර්ඝකාලීන රඳවාගැනීම් හේතුවිය හැකිය. දඬුවමක් නියම කිරීමට අධිකරණ ක්‍රියාවලියේ ප්‍රමාදයන් සැළකිය යුතු බලපෑමක් සිදු කරන අතර ඒ තුළින් රැඳවුම් කාලය මාස කිහිපයක් හෝ වසර කිහිපයක් දක්වා දීර්ඝ විය හැකිය. මෙසේ පූර්ව නඩු විභාග සඳහා රැඳවුම් භාරයේ සහ වෙනත් ආකාරයෙන් රිමාන්ඩ් සිරගත කිරීම්වලට ලක්ව පමණට වඩා වැඩි කාලයක් රැඳවුම්භාරයේ තැබීම ද බන්ධනාගාර තදබදය ඇති වීමට බලපායි.

### 3.2.2. මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධව බන්ධනාගාරගත වීම ඉහල යාම

මත්ද්‍රව්‍ය වැරදි වැඩිවීම රටේ අනෙකුත් අපරාධ ක්‍රියාකාරකම් වැඩිවීමට සෘජුවම බලපායි. තවද මත්ද්‍රව්‍ය වැරදි කරුවන්ගෙන් බොහෝමයක් මත්ද්‍රව්‍ය භාවිතය, සන්තකයේ තබා ගැනීම, මිලදී ගැනීම, විකිණීම සම්බන්ධයෙන් බන්ධනාගාර ගත වූවන් වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ගත රැඳවියන්ගෙන් විශාල ප්‍රමාණයක් මත්ද්‍රව්‍ය සඳහා වන වැරදි වලට සම්බන්ධ වූවන් වෙති. ලංකාවේ 2022 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර රැඳවියන් සංඛ්‍යාව 26,176 ක් වන අතර ඉන් සියයට 53 කට අධික පිරිසක් එනම් 13,794 ක් මත්ද්‍රව්‍ය වැරදි හා සම්බන්ධ වන රැඳවියන් වේ. මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් රැඳවියන් 4,406 දෙනෙකු සිරකරුවන් වන අතර 9,388 දෙනෙකු සැකකරුවන් වේ.

මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගත කරන රැඳවියන් දීර්ඝකාලීනව බන්ධනාගාර ගත වීමට හේතු වනුයේ,

(i.) මත්ද්‍රව්‍ය නීති යටතේ ඉතා සුළු ස්වභාවයේ වැරදිවලින් වුවද සිරගත කිරීමට සිදු වීම

(ii.) සිර ගත කිරීම වෙනුවට විකල්ප දඬුවම් ලබා දීමේ අවස්ථා නොමැති වීම හෝ සීමිතව පැවතීම.

(iii.) වරදේ ස්වභාවය සුළු හෝ විශාල යන්න නොසලකා මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධ නඩු විභාග අවසන් වන තුරු රක්ෂිත බන්ධනාගාර ගත කර තිබීම.

(iv.) මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් වන දඩුවම්, මිනී මැරුම් හෝ ස්ත්‍රී දූෂණ වැනි බරපතල හා ප්‍රචණ්ඩකාරී අපරාධ සඳහා වන දඩුවම් වලටත් වඩා දීර්ඝ කාලීන වීම.

(v.) මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධ සිරකරුවන් සිර සමාවන් සඳහා සලකා බැලීමේ හැකියාවක් නොතිබීම.

### 3.2.3. නීතිය ක්‍රියාත්මක කිරීම හා බන්ධනාගාරගත කිරීම සම්බන්ධව පරිපාලන ක්‍රියාවලියේ අඩුපාඩු

අපරාධ ක්‍රියාකාරකම් වැඩිවීමේ සෘජු ප්‍රතිඵලයක් ලෙස සිරගත කිරීම්වල ඉහළ යෑම බන්ධනාගාර තදබදය ඇති වීමට හේතු වුවද මීට අමතරව අපරාධකරුවන් හට නීතිය ක්‍රියාත්මක කිරීම හා බන්ධනාගාරගත කිරීම සම්බන්ධව පරිපාලන ක්‍රියාවලියේ අඩුපාඩු ද බන්ධනාගාර තදබදය නිර්මාණයට හේතු වී ඇත. විස්තර පහත දැක්වේ.

(අ) ඇප නියම කර ඇති එහෙත් ඇප කොන්දේසි සපුරාලීමට නොහැකි වීම හේතුවෙන් සැකකරුවන් බන්ධනාගාරගත කිරීම.

ගරු අධිකරණය මඟින් බන්ධනාගාර ගතවන රැඳවියන් වෙනුවෙන් ඇප නියම කර තිබුණද අදාළ රැඳවියන්හට ඇප කොන්දේසි සපුරාලීමට නොහැකි වීම හේතුවෙන් බන්ධනාගාරගත වීම.

උදාහරණ :-

2022 දෙසැම්බර් 31 දිනට ඇප නියම කර ඇති එහෙත් ඇප තබා ගැනීමට නොහැකි රැඳවියන් 1,795 ක් බන්ධනාගාර ගතව සිටින බව නිරීක්ෂණය විය.

| **බන්ධනාගාර ගතව ඇති කාලය** | **රැඳවියන් සංඛ්‍යාව** |
|---|---|
| මාස 03 අඩු | 855 |
| මාස 03ත් 06 අතර | 530 |
| මාස 06ත් 12 අතර | 268 |
| මාස 12 වැඩි | 142 |
| **එකතුව** | **1,795** |

(මූලාශ්‍රය - බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අංශය)

(ආ) රසපරීක්ෂණ වාර්තා අධිකරණයට ඉදිරිපත් නොකිරීම නිසා සැකකරුවන් දීර්ඝකාලීනව බන්ධනාගාරගත වීම.

1984 අංක 13 දරන විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග (සංශෝධන) 1929 අංක 17 දරන විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග ආඥා පනතේ 54 වන වගන්තිය යටතේ ( මෙම වගන්තිය 2022 අංක 41 දරන විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග (සංශෝධන) පනතින් සංශෝධනය කර ඇත.) අධිකරණය මඟින් බන්ධනාගාර ගත කර ඇති සැකකරුවන්ට අදාළව පොලිසිය විසින් රසපරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ මත්ද්‍රව්‍ය සාම්පල්වලට අදාළ රසපරීක්ෂණ වාර්තා මාස 12 ක් නොඉක්ම වන කාලසීමාවක් තුළ ඉදිරිපත් කළ යුතු වුවත් මෙම රසපරීක්ෂණ වාර්තා මෙතෙක් ඉදිරිපත් නොවීම නිසා 2022 දෙසැම්බර් 31 වන දිනට රක්ෂිත බන්ධනාගාරගත කර ඇති සැකකරුවන් සංඛ්‍යාව 5,676 දෙනෙකු විය. විස්තර පහත දැක්වේ.

| බන්ධනාගාර ගතව ඇති කාලය | රැඳවියන් සංඛ්‍යාව |
|---|---:|
| මාස 03 අඩු | 2,400 |
| මාස 03ත් 06 අතර | 2,223 |
| මාස 06ත් 12 අතර | 835 |
| මාස 12 වැඩි | 218 |
| **එකතුව** | **5,676** |

(මූලාශ්‍රය - බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අංශය)

(ඇ) ප්‍රජා විශෝධන නියෝග ලබා දීම සම්බන්ධයෙන් ජනතාව ප්‍රමාණවත් පරිදි දැනුවත් නොවීම නිසා සුළු දඩමුදල් ගෙවා ගැනීමට නොහැකි වූ පුද්ගලයින් සිරගත වීම.

මේ සම්බන්ධ පහත කරුණු අනාවරණය විය.

(i.) 1999 අංක 46 දරන ප්‍රජා පාදක විශෝධන පනත ප්‍රකාරව අවුරුදු 02 කට වඩා අඩු (අනිවාර්යය නොවන) සිර දඬුවම් සඳහා අධිකරණය මඟින් බන්ධනාගාර ගත කිරීමේ දඬුවමක්, අත්හිටවන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් හෝ දඩයක් නියම කිරීම වෙනුවට විකල්ප දඬුවමක් ලෙස ප්‍රජා පාදක විශෝධන ආඥාවක් නිකුත් කරනු ලබන අතර එම ආඥා ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටවා ඇති ආයතනය ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවයි.

(ii.) මෙම ක්‍රියාවලියේ දී අධිකරණයෙන් වරදකරුවෙකු වන තැනැත්තෙකු නිවැරදි කිරීම සඳහා ප්‍රජා විශෝධන නිලධාරීන් විසින් සකස් කරනු ලබන පූර්ව දණ්ඩන වාර්තාවේ නිර්දේශ කර ඇති කොන්දේසි මත වරදකරුගේ මනෝ සමාජීය ගැටලු, අවධානම් මට්ටම හා අවශ්‍යතාද සැලකිල්ලට ගනිමින්, පවතින සම්පත් හඳුනාගෙන පුද්ගලයාට ආවේනික වූ, උචිතම මැදිහත් වීමේ ක්‍රියාවලියකින් එම පුද්ගලයා සමාජය තුල තබා නිවැරදි තැනැත්තෙකු ලෙස සවිබල ගැන්වීමට කටයුතු කරයි. නමුත් මෙම ක්‍රියාවලිය සම්බන්ධව මහජනතාව ප්‍රමාණවත් පරිදි දැනුවත් වීමක් සිදුවී නොමැති වීම නිසා 2022 දෙසැම්බර් 31 දින වන විට සුළු දඩ මුදල් ගෙවා ගැනීමට නොහැකිව සිර දඬුවම් විඳින වැරදිකරුවන් 1,385 දෙනෙකු විය. මෙම වරදකරුවන් සිර ගත කල කාලය තුල නඩත්තු කිරීම සඳහා ඔවුන්ගෙන් අයවිය යුතු දඩ මුදලට වඩා වැඩි වියදමක් රජය විසින් දරනු ලබයි.

| බන්ධනාගාර ගතව ඇති කාලය | රැඳවියන් සංඛ්‍යාව |
| --- | --- |
| මාස 03 අඩු | 643 |
| මාස 03ත් 06 අතර | 371 |
| මාස 06ත් 12 අතර | 289 |
| මාස 12 වැඩි | 82 |
| **එකතුව** | **1,385** |

(මූලාශ්‍රය - බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අංශය)

(ඇ) රැඳවියන්ගේ අභියාචනා විසඳීමට ගතවන කාලය

රැඳවියන් විසින් ඉදිරිපත් කර තිබූ අභියාචනා සම්බන්ධව අධිකරණ ක්‍රියාවලියේ විවිධ හේතුන් මත විභාගයට නොගැනීම, ප්‍රමාද වී විභාගයට ගැනීම හා අවසන් නොවීම යන කරුණු හේතුවෙන් එය සමාන්‍ය පරිපාලනයෙන් බැහැරව පවතින කරුණකි. 2022 දෙසැම්බර් 31 දිනට අභියාචනා ඉදිරිපත් කොට අවසන් තීරණ ලබා ගැනීමට සිටි බන්ධනාගාර ගතව සිටි රැඳවියන් සංඛ්‍යාව 301 ක් විය. විස්තර පහත දැක්වේ.

| බන්ධනාගාර ගතව ඇති කාලය | සංඛ්‍යාව |
|---|---|
| මාස 03 අඩු | 22 |
| මාස 03ත් 06 අතර | 19 |
| මාස 06ත් 12 අතර | 27 |
| මාස 12 වැඩි | 233 |
| **එකතුව** | **301** |

(මූලාශ්‍රය - බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අංශය)

(ඉ) සිර වාට්ටු, සිරකුටි හා සිර මැදිරි සහ ගොඩනැගිලි අබලන්ව පැවතීම.

සිරකරුවන්ගේ සංඛ්‍යාව වැඩිවත්ම ඊට සාපේක්ෂව සිර වාට්ටු, සිරකුටි හා සිර මැදිරි සහිත ගොඩනැගිලි ඉදිකර නොමැති වීම හා අබලන් තත්ත්වයේ පවතින බන්ධනාගාරවල අළුත්වැඩියා කටයුතු සිදු නොවීම දැකිය හැකිය. විගණන අංශය විසින් බන්ධනාගාර තුළ සිදු කළ භෞතික පරීක්ෂාවලදී අළුත්වැඩියා නොකළ අබලන් තත්ත්වයේ පැවතුනු ගොඩනැගිලි විස්තර පහත දැක්වේ. මීට අමතරව වැලිකඩ බන්ධනාගාරයේ D හා වැපල් වාට්ටු පරිශ්‍රයන් ද අබලන්ව පැවතුණි.

| බන්ධනාගාර ආයතනය | විගණනය පරීක්ෂා කළ දිනය | අළුත්වැඩියා කළ යුතු ගොඩනැගිලි පරිශ්‍රයන් |
|---|---|---|
| අනුරාධපුරය | 2022 දෙසැම්බර් 14 දින | • අනුරාධපුර බන්ධනාගාරයේ කාන්තා අංශයේ A සිර වාට්ටුව<br>• අනුරාධපුර බන්ධනාගාරයේ වැඩිහිටියන් රඳවා තිබෙන වාට්ටුව |
| කළුතර | 2022 අගෝස්තු 02 දින | C1, C2, C3, C4 වාට්ටු පරිශ්‍රයන් |

(ඊ) බන්ධනාගාර තුල ඇති වන පශ්චාත් ගැටුම් තුලින් රැඳවියන් රඳවාගැනීමට ඇති නේවාසික ගොඩනැගිලි හා යටිතල පහසුකම් විනාශ වීම.

2011 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ බන්ධනාගාර ආයතන 02 ක ඇති වූ කැරලි හේතුවෙන් බන්ධනාගාර ගොඩනැගිලි කිහිපයක් විනාශ විය. විස්තර පහත දැක්වේ.

| බන්ධනාගාර ආයතනය | කැරැල්ල ඇති වූ දිනය |
|---|---|
| මහර | 2020 නොවැම්බර් 29 හා 30 |
| අනුරාධපුරය | 2011 ජනවාරි 24, 25 හා මාර්තු 21 |

(මූලාශ්‍රය - බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මූලා‍ය ප්‍රකාශන 2021 වර්ෂය)

(උ) නඩු විභාගයකට පෙර සැකකරුවන් දීර්ඝ කාලයක් ආරක්ෂිත බන්ධනාගාර ගත කිරීම බන්ධනාගාර තදබදය ඇති වීමට තවත් හේතුවක් වී ඇත.

රැඳවියන්ගෙන් වැඩි පිරිසක් සැකකරුවන් වන අතර එම රැඳවියන් සැමවිටම නිර්දෝෂිභාවයේ පූර්ව නිගමනයකට යටත්ය. එනම් මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 11 වන වගන්තියට අනුව ඔවුන් වරද ඔප්පු වන තෙක් නිවැරදිකරුවන් ලෙස සලකයි. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 1988 වර්ෂයේ දී සම්මතකොට ප්‍රකාශයට පත්කරන ලද සිරකරුවන්ට මානව ගරුත්වයෙන් යුතුව සැලකීම සඳහා අනුගමනය කළ යුතු 38 වන මූලධර්මය අනුව අපරාධ චෝදනා ලැබූවන් සාධාරණ කාලයක් තුළ නඩු විභාගයකට ලක් කොට අවසන් කළ යුතු බව අවධාරණය කර තිබේ. නමුත් ශ්‍රී ලංකාවේ සැකකරුවන් ලෙස සිටින බන්ධනාගාරගත රැඳවියන් සම්බන්ධ අධිකරණ ක්‍රියාවලිය හේතුවෙන් සැකකාර රැඳවියන් වශයෙන් දිගු කාලයක් බන්ධනාගාර ගතව සිටීමට සිදුව ඇත.

2017 සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ එක් එක් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සැකකරුවන් බන්ධනාගාර ගත වී සිටීමේ සාමාන්‍ය කාලපරාසය පහත පරිදි වේ.

| කාලය | 2017 | % | 2018 | % | 2019 | % | 2020 | % | 2021 | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාස 06ට අඩු | 7,680 | 70.2 | 10,331 | 73.4 | 10,163 | 69.4 | 8,022 | 63.9 | 7,458 | 67.7 |
| මාස 06 සිට මාස 12 දක්වා | 1,479 | 13.5 | 1,686 | 12.0 | 1,990 | 13.6 | 2,460 | 19.6 | 1,957 | 17.8 |
| මාස 12 සිට මාස 18 දක්වා | 725 | 6.6 | 802 | 5.7 | 1,072 | 7.3 | 909 | 7.2 | 653 | 5.9 |
| මාස 18 සිට අවුරුදු 02 දක්වා | 384 | 3.5 | 544 | 3.9 | 737 | 5.0 | 498 | 4.0 | 307 | 2.8 |
| අවුරුදු 02ට වැඩි | 679 | 6.2 | 705 | 5.0 | 680 | 4.6 | 658 | 5.2 | 642 | 5.8 |

(මූලාශ්‍රය - බන්ධනාගාර දෙපාර්තමේන්තු සංඛ්‍යාලේඛන වාර්තාව 2022 වර්ෂය)

(ඖ) 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් ප්‍රතිකාර හා පුනරුත්ථාපනය පිළිබඳ පනතේ 10.1 හා 10.2 වගන්තීන් යටතේ අන්තරාදායක ඖෂධ සඳහා තැනැත්තෙකු ඇබ්බැහි වී ඇත්ද යන්න සම්බන්ධයෙන් වෛද්‍ය වාර්ථා කැඳවීම අදාළ පුද්ගලයන් මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කිරීම ස්ථාන භාර පොලිස් නිලධාරී වෙත පවරා තිබුණ ද එම පුද්ගලයින්ගේ වෛද්‍ය වාර්ථා බන්ධනාගාරගත කිරීමෙන් පසුව ලබා ගැනීම ද බන්ධනාගාර තදබදය ඇතිවීමට හේතුවේ.

(එ) සුළු ආරවුල් මත රක්ෂිත බන්ධනාගාරගත වන රැඳවියන් සංඛ්‍යාව ඉහළ යාම නිසා බන්ධනාගාර තදබදයක් ඇති වන බවද නිරීක්ෂණය වේ. විස්තර පහත දැක්වේ.

(i.) යම් සිද්ධියක් සිදු වූ විට එයට සෘජුවම අදාළ පුද්ගලයින් පමණක් නොව සියලුම සැක සහිත පුද්ගලයින් අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කිරීමේ ප්‍රවණතාවය නිසාද බන්ධනාගාර තදබදය ඇති වීමට හේතු වී ඇත.

(ii.) විමර්ශන කටයුතු සැලකිය යුතු මට්ටමින් ප්‍රමාද වීමක් සිදුවන විට රැඳවියන්ට ඇප ලබාගත නොහැකිව අනවශ්‍ය කාල සීමාවක් රක්ෂිත බන්ධනාගාර තුළ සිටිමට සිදු වී ඇත.

## 3.3. බන්ධනාගාර තදබදය තුලින් මතුවන ගැටළු

### 3.3.1. රැඳවියන් නඩත්තු කිරීම සඳහා වැය වන වියදම වැඩි වීම.

(අ) රැඳවියන් නඩත්තු කිරීම සඳහා රජය විසින් වාර්ෂිකව පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම් වශයෙන් සැලකිය යුතු මුදලක් වැය කරන අතර, 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ දරන ලද වාර්ෂික සාමාන්‍ය වියදම රු.6,691,627,146 ක් වේ. විස්තර පහත දැක්වේ.

සිරකරුවන් නඩත්තු කිරීම සඳහා දරන ලද වියදම් 2017 – 2022

| වර්ෂය | පුනරාවර්ථන වියදම (රු.) | ප්‍රාග්ධන වියදම (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|
| -------- | ----------------- | ----------------- | ---------------- |
| 2017 | 4,761,873,732 | 1,077,977,050 | 5,839,850,782 |
| 2018 | 5,169,546,549 | 422,925,301 | 5,592,471,850 |
| 2019 | 5,759,000,738 | 451,641,682 | 6,210,642,420 |
| 2020 | 6,801,874,512 | 257,561,753 | 7,059,436,265 |
| 2021 | 6,544,158,600 | 507,280,296 | 7,051,438,896 |
| 2022 | 8,068,959,907 | 326,962,758 | 8,395,922,665 |
| | | | **40,149,762,878** |

(මූලාශ්‍රය - බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන වාර්තා )

මීට අමතරව වෙනත් දෙපාර්තමේන්තු වැය විෂයයන් යටතේ ද මුදල් වැය කරනු ලබයි. උදාහරණ වශයෙන් බන්ධනාගාර රෝහල්වල සේවය කරනු ලබන ශ්‍රේණිගත වෛද්‍යවරුන් 47 කට හා ලියාපදිංචි/ සහකාර වෛද්‍යවරුන් 23 කට වැටුප් හා දීමනා ගෙවීම සහ එම රෝහල්වලට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන ඖෂධ සඳහා වැය වන වියදම මෙම අරමුණ සඳහාම වන වියදමක් වුවත්, එම වියදම සමස්ත පුනරාවර්ථන වියදම තුළ ඇතුළත් වී නොමැති බැවින් ඉහත පුනරාවර්ථන වියදම තවදුරටත් වැඩි වන අතර මෙහිදී එම වියදම් ගණනය කර නොතිබුණි.

(ආ) රැඳවියන් නඩත්තු කිරීමට යන වියදම් විශ්ලේෂණය කිරීමේ දී බන්ධනාගාරගත රැඳවියන් සංඛ්‍යාව වැඩි වීමත් සමඟ ඔවුන් සඳහා වැයවන ආහාර, බෙහෙත්, ජලය හා සිර ඇඳුම් වෙනුවෙන් දරන වියදම් ඉහළ යාමක් සිදු වේ. විස්තර පහත පරිදිවේ.

(i.) නියැඳි පරීක්ෂාවට ලක්වූ මහර බන්ධනාගාරයේ 2022 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුල එක් එක් මාසයේ අවසන් දිනට රැඳවියන් සංඛ්‍යාවත්, මහර බන්ධනාගාරය සම්බන්ධයෙන් ඒ ඒ මාසය තුල රැඳවියන් වෙනුවෙන් දරණ ලද වියදම් පහත වගුවෙන් දැක්වේ.

| මාසය | එක් එක් මාසයේ අවසන් දිනට රැඳවියන් සංඛ්‍යාව | එක් එක් මාසයේ රැඳවියන් වෙනුවෙන් දරන ලද වියදම් (රු.) | | |
|---|---|---|---|---|
| | | ආහාර | ජලය | විදුලිය |
| ජනවාරි | 1,808 | 9,569,080 | 226,566 | 919,144 |
| පෙබරවාරි | 1,928 | 8,908,622 | 239,170 | 882,822 |
| මාර්තු | 1,822 | 9,881,822 | 233,729 | 787,734 |
| අප්‍රේල් | 1,712 | 18,219,288 | 230,964 | 848,489 |
| මැයි | 1,883 | 29,807,200 | 253,294 | 693,957 |
| ජූනි | 1,936 | 29,566,036 | 272,939 | 773,655 |
| ජූලි | 2,081 | 34,302,603 | 373,283 | 755,809 |
| අගෝස්තු | 2,495 | 38,996,733 | 389,936 | 831,291 |
| සැප්තැම්බර් | 2,799 | 41,462,382 | 518,689 | 1,069,998 |
| ඔක්තෝම්බර් | 2,869 | 45,607,672 | 577,800 | 1,095,915 |
| නොවැම්බර් | 2,881 | 46,743,306 | 683,905 | 1,184,059 |
| දෙසැම්බර් | 2,901 | 45,726,642 | 679,311 | 1,166,482 |

(මූලාශ්‍රය - මහර බන්ධනාගාරයෙන් ලබාගත් තොරතුරු)

ඉහත කාල පරිච්ඡේදය තුල එක් එක් මාසයේ අවසන් දිනට රැඳවියන් සංඛ්‍යාවත්, ඒ ඒ මාසය තුල ඔවුන්ගේ ජල පරිභෝජනය හා ඒ වෙනුවෙන් දරණ ලද වියදම් වැඩිවීම කෙරෙහි මෙම වාර්තාවේ සාකච්ඡා කෙරෙන ගැටළු බලපා තිබුණි.

### 3.3.2. සිරකරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධ ගැටළු

(අ) 2022 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර උදෑසන විවෘතය අනුව රැඳවියන්ගෙන් සියයට 53 ක් මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වන වැරදි සඳහා දඬුවම් විඳින හා සැක පිට රඳවා ඇති රැඳවියන් වේ. මෙම රැඳවියන්ගෙන් ද සියයට 68 ක් සැක පිට රඳවා ඇති රැඳවියන් වේ. එසේම 2021 බන්ධනාගාර සංඛ්‍යාලේඛණ අනුව දඬුවම් ලබා බන්ධනාගාර ගත කරන ලද රැඳවියන්ගෙන් සියයට 64.2 ක් අන්තරායකර මත්ද්‍රව්‍ය සඳහාත් සියයට 8.3 ක් සුරාබදු ආඥා පනත උල්ලංඝනය කිරීමෙන් හා සියයට 1.6 ක් බීමතින් ප්‍රසිද්ධ ස්ථාන වල රැඳී සිටීම නිසාත් බන්ධනාගාර ගත කර ඇත. ඒ අනුව සිරකරුවන්ගෙන් මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි වලට 2021 වර්ෂයේ සමස්ත ඇතුලත් කිරීම් සියයට 74.1 ක් බව නිරීක්ෂණය විය. බන්ධනාගාරවල

පවතින මෙම අසාමාන්‍ය තදබදයට මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි නිසා බන්ධනාගාරගත වීම් ප්‍රධාන හේතුවක් බවත්, එය බන්ධනාගාරයේ ප්‍රධාන අරමුණු කරා ලගා වීමට මෙන්ම බන්ධනාගාර අභ්‍යන්තර ආරක්ෂාව හා ක්‍රියාකාරීත්වයට ද එය බාධාවක් වී ඇත.

(ආ) බන්ධනාගාරගත වන රැඳවියන් සංඛ්‍යාව වැඩිවෙත්ම අධිකරණය වෙත ඉදිරිපත් කිරීම, නියමිත සිර දඩුවම් ක්‍රියාත්මක කිරීම, ආරක්ෂිතව රඳවා තබා ගැනීම වැනි කාර්යයන් සඳහා ප්‍රමාණවත් භෞතික හා මානව සම්පත් නොමැති වීම තුළ රැඳවියන් රැඳවුම්භාරයේ සිටියදී පැන යාමට හා මිදී යාමට උත්සහ කරයි. පසුගිය වර්ෂ 06 තුළරැඳවුම්භාරයේ සිටියදී අත්අඩංගුවෙන් පැන ගිය හා මිදීගිය රැඳවියන් සංඛ්‍යාව පහත පරිදි වේ.

රැඳවුම් භාරයේ සිටියදී අත්අඩංගුවෙන් පැන ගිය හා මිදී ගිය රැඳවියන් සංඛ්‍යාව

| විස්තරය | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|
| මිදී ගිය රැඳවියන් සංඛ්‍යාව | 71 | 94 | 101 | 63 | 74 | 171 |
| අත්අඩංගුවෙන් පැන ගිය සිරකරුවන් සංඛ්‍යාව | 06 | 13 | 11 | 19 | 05 | 17 |
| අත්අඩංගුවෙන් පැන ගිය සැකකරුවන් සංඛ්‍යාව | 27 | 46 | 41 | 35 | 32 | 43 |

(මූලාශ්‍රය - බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තා)

(ඇ) 2022 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය අනුව විවිධ වර්ගීකරණ යටතේ තනතුරු 85 ක් වෙනුවෙන් අනුමත නිලධාරීන් සංඛ්‍යාව 7,872 ක් විය. මින් තනතුරු 68 ක පුරප්පාඩු සංඛ්‍යාව 1,617 ක් පැවතුණි. මෙසේ අනුමත සංඛ්‍යාවෙන් සියයට 21 කට වඩා ප්‍රතිශතයකි. බන්ධනාගාර නිලධාරීන්ගේ පුරප්පාඩු පැවතීමත්, බන්ධනාගාර තදබදය වැඩි වීමත් තුළ බන්ධනාගාර පරිපාලන කටයුතු සිදු කිරීම අපහසු වී ඇත. රැඳවියන් සංඛ්‍යාවට සාපේක්ෂව නිලධාරීන් හිඟවීම නිසා ඔවුන් අතින් රාජකාරී මඟහැරී යාමෙන් සිරකරුවන්ගේ අයිතිවාසිකම් ලබාදීමේ ගැටළු මතුවිය හැක. මෙහිදි මානව හිමිකම් ආරක්ෂා නොවීම්, වෛද්‍ය පහසුකම් සැපයීමේ දුෂ්කරතා, බෝවන රෝග පැතිරීම් වැනි ගැටළුවලට මුහුණ දීමට සිදු වීමෙන් ඒවා ඇතැම්විට ගැටළුකාරී තත්ත්වයන් දක්වා වර්ධනය විය හැක.

**3.3.3. සැකකරුවන් වන රැඳවියන්ගේ ශ්‍රම දායකත්වය රටේ ආර්ථිකයට යොදාගත නොහැකි වීම.**

රැඳවියන්ගෙන් සැළකිය යුතු ප්‍රමාණයක් සැකකරුවන් වශයෙන් බන්ධනාගාරගත වී සිටින අතර එම සැකකරුවන් බොහෝ කාලයක් බන්ධනාගාරගත වී සිටියද ඔවුන් වරදකරුවන් සේ නොසලකයි. එබැවින් මෙම රැඳවියන් බන්ධනාගාර ගත වී ඇති කාලපරිච්ඡේදය තුළ ඔවුන්ගේ ශ්‍රම දායකත්වය රටේ ශ්‍රම බලකායට දායක කර ගැනීමට නොහැකි වී ඇත.

(අ) පසුගිය වර්ෂ 05 තුළ මුළු රැඳවියන්ගේ ප්‍රතිශතයක් ලෙස, බන්ධනාගාර ගත සැකකරුවන් ප්‍රමාණය සියයට 58 සිට සියයට 65 දක්වා පරාසයක පැවතුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | සැකකරුවන් ප්‍රමාණය | සිරකරුවන් ප්‍රමාණය | මුළු රැඳවියන් ප්‍රමාණය | සැකකරුවන් ප්‍රමාණය මුළු රැඳවියන්ගේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|
| 2018 | 14,077 | 9,287 | 23,364 | 60% |
| 2019 | 14,642 | 10,466 | 25,108 | 58% |
| 2020 | 12,529 | 6,870 | 19,399 | 65% |
| 2021 | 11,017 | 7,356 | 18,373 | 60% |
| 2022 | 16,727 | 9,449 | 26,176 | 64% |

(මූලාශ්‍රය - බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අංශය)

(ආ) 2021 දෙසැම්බර් 31 දිනට රක්ෂිත බන්ධනාගාර ගත කරන ලද සැකකරුවන් සියයට 61 ට වඩා වැඩි ප්‍රමාණයක් මසක කාල සීමාවේ සිට වසර පහකට වැඩි කාල සීමාවක් තුළ රක්ෂිත බන්ධනාගාර ගතව සිටි රැඳවියන් වේ. විස්තර පහත දැක්වේ.

2021 දෙසැම්බර් 31 දිනට සැකකරුවන් රඳවා තබා ගැනීම.

| කාල පරාසය | පිරිමි | ගැහැණු | එකතුව | මුළු සැකකරුවන්ගෙන් ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|
| දවස් 14 අඩු | 1,950 | 95 | 2,045 | 18.6 |
| දවස් 14 සිට මාස 01 ට අඩු | 2,143 | 79 | 2,222 | 20.2 |
| මාස 01 සිට මාස 06 ට අඩු | 3,013 | 178 | 3,191 | 29.0 |
| මාස 06 සිට අවුරුදු 01 ට අඩු | 1,810 | 147 | 1,957 | 17.8 |
| අවුරුදු 01 සිට අවුරුදු 1 ½ ට අඩු | 603 | 50 | 653 | 5.9 |
| අවුරුදු 1 ½ සිට අවුරුදු 02 ට අඩු | 269 | 38 | 307 | 2.8 |
| අවුරුදු 02 සිට අවුරුදු 03 ට අඩු | 279 | 19 | 298 | 2.7 |
| අවුරුදු 03 සිට අවුරුදු 04 ට අඩු | 147 | 05 | 152 | 1.4 |
| අවුරුදු 04 සිට අවුරුදු 05 ට අඩු | 64 | 05 | 69 | 0.6 |
| අවුරුදු 05 සහ ඊට වැඩි | 118 | 05 | 123 | 1.1 |
| රැඳවුම් නියෝග මත | - | - | - | - |
| | **10,396** | **621** | **11,017** | **100** |

(මූලාශ්‍රය - බන්ධනාගාර දෙපාර්තමේන්තු සංඛ්‍යාලේඛන වාර්තාව 2022 වර්ෂය)

(ඇ) රක්ෂිත බන්ධනාගාර ගත කරන ලද සැකකරුවන්ගෙන් වැඩි ප්‍රතිශතයක් රටක ශ්‍රම බලකායට අයත් සක්‍රීය වයස් කාණ්ඩයේ පසුවන්නන් වේ. පසුගිය වර්ෂ 06 තුළ වයස් කාණ්ඩ අනුව සැකකරුවන් සෘජුව බන්ධනාගාර ගත වීම සැලකීමේදී සියයට 87 කට වඩා වැඩි සැකකරුවන් ප්‍රමාණයක් අවුරුදු 22 ත් 60 ත් අතර විය. විස්තර පහත දැක්වේ.

වයස් කාණ්ඩ අනුව සැකකරුවන් සෘජුව බන්ධනාගාර ගත වීම.

(2017-2022)

| වයස් කාණ්ඩය | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| අවු:16ට අඩු | 428 | 300 | 168 | 102 | 87 |
| අවු: 16-22 අතර | 6,812 | 10,822 | 11,203 | 8,084 | 4,872 |
| අවු: 22-30 අතර | 22,556 | 24,413 | 29,143 | 21,891 | 14,996 |
| අවු: 30-40 අතර | 31,311 | 33,817 | 34,243 | 28,201 | 21,078 |
| අවු: 40-50 අතර | 22,717 | 23,434 | 24,643 | 20,606 | 13,495 |
| අවු: 50-60 අතර | 11,039 | 10,819 | 10,772 | 8,556 | 5,685 |
| අවු: 60 වැඩි | 4,173 | - | - | - | - |
| අවු: 60 - 70 අතර | - | 3,591 | 4,155 | 2,490 | 1,861 |
| අවු: 70 වැඩි | - | 1,067 | 998 | 432 | 352 |
| **එකතුව** | **99,036** | **108,263** | **115,325** | **90,362** | **62,426** |

(මූලාශ්‍රය - බන්ධනාගාර දෙපාර්තමේන්තු සංඛ්‍යාලේඛන වාර්තාව 2022 වර්ෂය)

(ඈ) 2021 වර්ෂට සාපේක්ෂව 2022 වර්ෂය තුළ සාමාන්‍ය මාසික සැක සංඛ්‍යාව සියයට 11 කට ආසන්න ප්‍රමාණයකින් වැඩි වී තිබුණි. විස්තර පහත පරිදි විය.

| මාසය | 2021 වර්ෂය | 2022 වර්ෂ |
|---|---|---|
| ජනවාරි | 11,894 | 11,360 |
| පෙබරවාරි | 11,835 | 11,866 |
| මාර්තු | 11,884 | 12,122 |
| අප්‍රේල් | 12,916 | 11,637 |
| මැයි | 12,481 | 12,148 |
| ජූනි | 12,511 | 12,194 |
| ජූලි | 13,141 | 12,796 |
| අගෝස්තු | 12,923 | 14,870 |
| සැප්තැම්බර් | 12,938 | 15,651 |
| ඔක්තෝබර් | 12,585 | 16,590 |
| නොවැම්බර් | 11,788 | 16,459 |
| දෙසැම්බර් | 11,017 | 16,727 |
| | **147,913** | **164,420** |

(මූලාශ්‍රය - බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අංශය)

### 3.3.4. රැඳවියන් පුනරුත්ථාපනය සම්බන්ධ ගැටළු

කාලීන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි රැඳවියන් පුනරුත්ථාපනය කර යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීමට අවශ්‍ය සමාජ පසුබිම සැකසීම බන්ධනාගාරයේ ප්‍රධාන කාර්යයන් අතුරින් එකකි. එහිදී අධ්‍යාපනය, කාර්යයක නිරත වීම වැනි අර්ථවත් ක්‍රියාකාරකම් සහ වෙනත් වැඩසටහන් වෙත රැඳවියන් යොමු කිරීම හා සාධනීය බන්ධනාගාර පරිසරයක් නිර්මාණය කර රැඳවියන්ගේ ශක්තිය නිර්මාණාත්මක වෘත්තීන් වෙත යොමු කිරීමෙන් පසුව සමාජයට නැවත ඇතුලත් කිරීම සඳහා සූදානම් කිරීමට සහය වීමක් ඇතිවන පරිදි පුනරුත්ථාපන කටයුතු පවත්වාගෙන යා යුතුය. නමුත් බන්ධනාගාර තදබදය හමුවේ රුැඳවියන් පුනරුත්ථාපනයේදී පහත ගැටළු මතුවේ.

(අ) පුනරුත්ථාපන සඳහා මානව හා භෞතික සම්පත් ප්‍රමාණවත් පරිදි නොමැති වීම.

බන්ධනාගාරගතවන සිරකරුවන් සංඛ්‍යාවද ක්‍රමයෙන් වැඩිවීමේ දී ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා තිබෙන මානව හා භෞතික සම්පත් ප්‍රමාණවත් පරිදි නොමැති වීම නිසා සිරකරුවන් විධිමත් පරිදි පුනරුත්ථාපනය කිරීමට නොහැකි වේ. අන්තරායක ඖෂධ පාලන ජාතික මණ්ඩලය මඟින් පාලනය

වන්නා වූ මහනුවර, නවදිගන්තය, ගාල්ල, තලංගම මධ්‍යස්ථාන් හි වරකට රඳවා තැබිය හැකි පුනරුත්ථාපනලාභීන් සංඛ්‍යාව 160 ක් පමණි. තවද මෙම මධ්‍යස්ථානවල උපරිම සේවාලාභීන් ප්‍රමාණය නේවාසිකව ඇත්නම් පොරොත්තු ලේඛනයට ඇතුළත් කරනු ලබයි. මෙම මධ්‍යස්ථාවල උග්‍ර මානසික රෝගී තත්ත්වයන් උදෙසා මානසික වෛද්‍ය ප්‍රතිකාර සේවාවන් නොපවති. මෙවැනි වාතාවරණයක් යටතේ පුනරුත්ථාපනය විය යුතු රැඳවියන් පුනරුත්ථාපන මධ්‍යස්ථාන සතුව ප්‍රමාණවත් පහසුකම් නොතිබීම හේතුවෙන් බන්ධනාගාර තුළ රඳවා තබා ගැනීමට සිදුවේ.

(ආ) අධිකරණ නියෝග ලබාදී ඇති රැඳවියන් පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත යොමු කරන තෙක් බන්ධනාගාර ගතව සිටිමට සිදු වීම.

බන්ධනාගාර ආයතනය 03 ක 2022 නොවැම්බර් 01 දින වන විට අධිකරණය මඟින් පුනරුත්ථාපනය සඳහා නියෝග ලබා දී පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත යොමු කිරීමට අපේක්ෂාවෙන් බන්ධනාගාර ගතව සිටි සිරකරුවන් පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි විගණනයට අනාවරණය විය.

| විස්තරය | සිරකරුවන් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | මීගමුව | මහර | වැලිකඩ |
| සිරගත වූ දිනයේ සිට මාසයකට අඩු | 02 | 10 | - |
| සිරගත වූ දිනයේ සිට මාසයකට වැඩි මාස දෙකට අඩු | 02 | 01 | 01 |
| සිරගත වූ දිනයේ සිට මාස දෙකකට වැඩි මාස තුනකට අඩු | 03 | - | - |
| සිරගත වූ දිනයේ සිට මාස තුනකට වැඩි මාස හතරකට අඩු | 04 | - | 56 |
| සිරගත වූ දිනයේ සිට මාස හතරට වැඩි මාස පහකට අඩු | 03 | - | - |
| සිරගත වූ දිනයේ සිට මාස පහට වැඩි මාස හයට අඩු | 02 | - | - |
| සිරගත වූ දිනයේ සිට මාස හයට වැඩි | 13 | - | 1271 |
| **එකතුව** | **29** | **11** | **1328** |

(මූලාශ්‍රය - ඉහත වගුවේ සඳහන් ඒ ඒ බන්ධනාගාර ආයතවලින් ලබාගත් තොරතුරු)

### 3.3.5. සිරකරුවන් නැවත නැවත සිරගතවීම

සිරකරුවන් විධිමත් පරිදි පුනරුත්ථාපනය කිරීමට නොහැකි වූ විට ඔවුන් නැවත නැවත බන්ධනාගාරගත වීම වැළැක්විය නොහැක. බන්ධනාගාරවල සිටින සිරකරුවන්ගෙන් වැඩි පිරිසක් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් නිසා ඔවුන් සඳහා අවශ්‍ය ප්‍රතිකාර කිරීම් හා විධිමත් පුනරුත්ථාපන වැඩසටහන් බන්ධනාගාර පද්ධතිය තුළ ක්‍රියාත්මක කළ යුතුය. එසේම බන්ධනාගාරයෙන් නිදහස ලැබූ පසුද මොවුන් ප්‍රජා සේවාවන්ට කිසිදු සම්බන්ධයක් නොමැතිනම් සහ අඛණ්ඩව රැකවරණය මොවුන්ට නොලැබේ නම් නැවතත් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා පෙළඹීමේ සම්භාවිතාවයක් පවතී. එබැවින් මොවුන් නැවත නැවත සිරගත වීම සිදුවිය හැක. ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ගතවූ සිරකරුවන්ගෙන් සැළකිය යුතු සංඛ්‍යාවක් නැවත නැවත සිරගත වූ සිරකරුවන් වේ.

(අ) 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා නැවත නැවත සිරගත වූ සිරකරුවන් පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | එක් වතාවක් සිර දඬුවම් නියම වූ (First Offenders) | දෙවතාවක් සිර දඬුවම් නියම වූ (Reconvicted) | දෙවතාවකට වැඩි සිර දඬුවම් නියම වූ (Recidivist) | එකතුව | ප්‍රතිශතය එක් වතාවක් | ප්‍රතිශතය දෙවතාවක් | ප්‍රතිශතය දෙවතාවකට වැඩි |
|---|---|---|---|---|---|---|---|
| 2017 | 10,787 | 7,475 | 4,571 | 22,833 | 47.2 | 32.7 | 20.0 |
| 2018 | 15,377 | 6,638 | 2,837 | 24,852 | 61.9 | 26.7 | 11.4 |
| 2019 | 16,110 | 7,817 | 5,237 | 29,164 | 55.2 | 26.8 | 18.0 |
| 2020 | 10,559 | 4,800 | 4,497 | 19,856 | 53.2 | 24.2 | 22.6 |
| 2021 | 8,296 | 3,995 | 2,256 | 14,547 | 57.0 | 27.5 | 15.5 |

(මූලාශ්‍රය - බන්ධනාගාර දෙපාර්තමේන්තු සංඛ්‍යාලේඛන වාර්තාව 2022 වර්ෂය)

(ආ) 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් නැවත නැවත සිරගත වූ සිරකරුවන් පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වෙන අතර ඒ සඳහා හේතු සාධක ලෙස ඔවුන් සඳහා විධිමත් පුනරුත්ථාපනයක් සිදු නොවීම මෙහිදි බැහැර කළ නොහැක.

| වර්ෂය | එක් වතාවක් සිර දඬුවම් නියම වූ (First Offenders) | දෙවතාවක් සිර දඬුවම් නියම වූ (Reconvicted) | දෙවතාවකට වැඩි සිර දඬුවම් නියම වූ (Recidivist) | එකතුව | ප්‍රතිශතය | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | එක් වතාවක් | දෙවතාවක් | දෙවතාව කට වැඩි |
| ------- | -------------- | ---------------- | -------------- | -------- | --------- | ---------- | --------- |
| 2017 | 3,203 | 4,420 | 2,966 | 10,589 | 30.2 | 41.7 | 28 |
| 2018 | 5,090 | 5,117 | 2,609 | 12,816 | 39.7 | 39.9 | 20.4 |
| 2019 | 6,137 | 5,037 | 3,949 | 15,123 | 40.6 | 33.3 | 26.1 |
| 2020 | 4,250 | 3,156 | 1,930 | 9,336 | 45.5 | 33.8 | 20.7 |
| 2021 | 4,100 | 3,542 | 1,702 | 9,344 | 43.9 | 37.9 | 18.2 |

(මූලාශ්‍රය - බන්ධනාගාර දෙපාර්තමේන්තු සංඛ්‍යාලේඛන වාර්තාව 2022 වර්ෂය)

(ඇ) නියැදි පදනමක් මත බන්ධනාගාර 05ක සිදු කළ භෞතික පරීක්ෂාවේදී 2022 ජනවාරි සිට අගෝස්තු මාසය අවසානය දක්වා කාලපරිච්ඡේදය තුල නැවත නැවත බන්ධනාගාර ගත වී ඇති සිරකරුවන් 1,029 දෙනෙකු නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| බන්ධනාගාරය | විගණන කාල සීමාව | නැවත නැවත බන්ධනාගාරගතව සිටි සිරකරුවන් සංඛ්‍යාව |
|---|---|---|
| ------------------ | ------------------------- | ----------------------- |
| මහර බන්ධනාගාරය | 2022/01/01 සිට 2022/08/31 දින දක්වා | 776 |
| වටරැක එළිමහන් වැඩ කඳවුර | 2022/01/01 සිට 2022/08/31 දින දක්වා | 212 |
| කළුතර රිමාන්ඩ් බන්ධනාගාරය | 2022/08/02 දින වන විට | 04 |
| බදුල්ල රිමාන්ඩ් බන්ධනාගාරය | 2022/06/20 දින වන විට | 11 |
| කෑගල්ල රිමාන්ඩ් බන්ධනාගාරය | 2022/06/06 දින වන විට | 26 |
| **එකතුව** | | **1,029** |

### 3.3.6. සිරකරුවන් පුනරුත්ථාපනය කිරීමේ අරමුණින් පුද්ගලික අංශයේ ව්‍යාපෘතිවල සිර ශ්‍රමය යෙදවීම

බන්ධනාගාර තදබදය ඉහළ යාමත් සමඟ රැඳවියන් ප්‍රමාණය වැඩිවීම නිසා සිරකරුවන් පුනරුත්ථාපනය කිරීමට තිබෙන භෞතික හා මානව සම්පත් හිඟතාවය මත සිරකරු ශ්‍රමය පුද්ගලික අංශයේ ව්‍යාපෘතිවල යෙදවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2020 මැයි 14 දිනැති අංක 20/0792/207/025 යටතේ අනුමැතිය ලැබී තිබුණි. නමුත් පෞද්ගලික සමාගම්වල සේවයේ යෙදපු සිරකරුවන්ට ඒ සඳහා අදාළ ක්ෂේත්‍රයේ මාස 03 ක පුහුණුවක්, වෘත්තීය මට්ටමමේ සහතිකයක් (NVQ) ලබා දීමක්, විදේශීය රැකියා සඳහා විදේශිය භාෂා පහුණුවක් ලබා දී නොතිබුණි.

### 3.3.7. බන්ධනාගාරගතවන්නන් ඉහළයාම හේතුවෙන් මතුවන සමාජ හා ආර්ථික ගැටළු

(අ) රැඳවියන්ගේ පවුල්වල සමාජිකයින්හට සමාජීය, ආර්ථික ගැටලුවලට මුහුණ දීමට සිදු වීම.

රැඳවියන් බොහෝ පිරිසක් තම පවුල් ඒකකවල ප්‍රධාන පුරුක්වේ. එනම් පවුලක මව, පියා හා වැඩිහිටි සහෝදර සහෝදරියන් වේ. මෙම පුද්ගලයින් සම්බන්ධ අධිකරණ ක්‍රියාමාර්ග අවසන් කිරීමට බොහෝ කාලයක් ගත වීම නිසා සැකකරුවන් වශයෙන් බන්ධනාගාරගත වී සිටින අතර ඒ තුළින් එම පවුල්වල ප්‍රධාන ආර්ථික ආදායම් මාර්ග අඩාල විය හැක. එම පවුල්වල සාමාජිකයින්ට මෙම රැඳවියන් නිදහස් කර ගැනීම සඳහා නීති වියදම් වශයෙන් විශාල මුදලක් දිගින් දිගටම දැරීමට සිදුවීම නිසා එම පවුල්වල කුටුම්භ ආර්ථිකය කඩා වැටීමට එය හේතුවක් විය හැක. තවදුරටත් සැකකරුවන් දිගු කාලයක් බන්ධනාගාර ගත වී සිටීම නිසා දරුවන්ට දෙමව්පිය සෙනෙහස අහිමි වීම හා එම පවුල්වල සාමාජිකයන්ට සාමාජයෙන් ඇති වන පිළිගැනීම අඩුවීම ආදී කරුණු හේතුකොටගෙන එම පවුල්වලට සමාජීය ආර්ථික ප්‍රශ්න රාශියකට මුහුණ දීමට සිදු වේ.

(ආ) සමස්ථ සමාජයට මුහුණ දීමට සිදුවන ගැටළු.

ශ්‍රී ලංකාවේ සංස්කෘතිය අනුව පිතෘ මූලික පවුල් ක්‍රමයක් දක්නට ලැබේ. එහිදි ගෘහමූලිකයා මොනයම් හෝ වරදක් නිසාවෙන් බන්ධනාගාරගත වීමේ දී සිරකරුගේ පවුලේ සාමාජිකයන් වින්දිත භාවයට පත්වීම තුළින් සමස්ථ සමාජයටම ගැටළු රාශියකට මුහුණු දීමට සිදු වේ. සිරකරුවන්ගේ පවුල් ඒකක තුළ ආදායම් උත්පාදනය කරන්නා අහිමි වීමෙන් පවුල් බිඳීයාම, දරුවන් අපරාධකාරී චරිතබවට පත්වීමේ ප්‍රවනතා තුළින් සමාජයටද ගැටළුකාරී තත්ත්වයන්ට ද මුහුණු දීමට සිදුව තිබේ

අනෙක් අතට කාන්තාවන් බන්ධනාගාරගත වූ පසු ඔවුන්ගේ දරුවන් මුහුණ දෙන තත්ත්වය ශෝචනීය වේ. දරුවෙකු තම මවගෙන් ලබන සෙනෙහස, දයාව, කාරුණාව, ආරක්ෂාව දරුවාගේ මානසික වර්ධනයට උපකාරී වන අතර එම අවශ්‍යතා නිසි පරිදි ඉටු නොවීමෙන් දරුවන් ක්‍රමයෙන් වැඩෙත්ම සමාජයේ නොයෙකුත් ව්‍යසනකාරී කටයුතු සඳහා පෙළඹිය හැකිය.

(ඇ) සුළු වැරදි කරුවන් සංවිධානාත්මක අපරාධකරුවන් බවට පත්වීමේ ඉඩකඩ පැවතීම.

රැඳවියන් බන්ධනාගාරගත වන ප්‍රමාණය වැඩිවීමට සාපේක්ෂව බන්ධනාගාර ඉඩකඩ ප්‍රමාණය වැඩි නොවීම නිසා බන්ධනාගාර ආඥා පනතතේ 54 වන ඡේදයට අදාළ 178 රීතිය අනුව රැඳවියන් වර්ගීකරණය කළද පූර්ණ වර්ගීකරණයකින් තොරව රඳවා තබා ගැනීමට සිදු වේ. මෙම තත්ත්වය යටතේ සුළු වැරදිකරුවන් සංවිධානාත්මක අපරාධකරුවන් බවට පත්වීමේ පරිසරයක් නිර්මාණය වීමට ඉඩ සැලසේ.

විගණනය විසින් බන්ධනාගාරවල සිදුකළ භෞතික පරීක්ෂාවලදී අවස්ථා 04 කදී රැඳවියන් 2,222 දෙනෙකු වර්ගීකරණයකින් තොරව රඳවා තැබීම නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| බන්ධනාගාරය | පරීක්ෂාවට ලක් වූ විගණිත දිනය | වර්ගීකරණයෙන් තොරව රඳවා සිටි රැඳවියන් සංඛ්‍යාව |
|---|---|---|
| ----------------- | --------------- | -------------------- |
| වටරැක එළිමහන් වැඩ කඳවුර | 2022/09/28 | 239 |
| මාතර රිමාන්ඩ් බන්ධනාගාරය | 2022/06/30 | 428 |
| කළුතර රිමාන්ඩ් බන්ධනාගාරය | 2022/08/02 | 934 |
| වාරියපොල රිමාන්ඩ් බන්ධනාගාරය | 2022/07/25 | 621 |
| **එකතුව** | | **2,222** |

## 3.4. බන්ධනාගාර තදබදය අවම කිරීමට මෑතකදී ගෙන ඇති පියවර

### 3.4.1. නව ගොඩනැගිලි ඉදි කිරීමට යෝජනා කර ඒ සඳහා සැලසුම් ඉදිරිපත් කිරීම.

බොරැල්ලේ පිහිටි වැලිකඩ බන්ධනාගාර සංකීර්ණය හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි නාගරික සංවර්ධන අධිකාරිය සතු මිල්ලෑව නැමැති ප්‍රදේශයේ, මෙම බන්ධනාගාරය වෙනුවෙන් අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රුපියල් බිලියන 30.6 ක අපේක්ෂිත පිරිවැයක් මත ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියක් දැනට සැලසුම් කර ඇත.

(අ) මෙම ව්‍යාපෘතිය මඟින් රැඳවියන්ගේ අයිතිවාසිකම් සම්මත ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුගත වන සේ ආරක්ෂා කිරීමත්, රැඳවියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමටත් විධිමත් අයුරින් රැඳවියන් පුනරුත්ථානය කිරීමත් අපේක්ෂිතය. මෙම නව ව්‍යාපෘතිය මඟින් පහත සඳහන් පරිදි ගොඩනැගිලි ඉඩ ප්‍රමාණ අවශ්‍යතා සපුරාලීමට දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ.

| ගොඩනැගිලි පරිශ්‍රය | යෝජිත ප්‍රමාණය (ව.මී) |
|---|---|
| වැලිකඩ සංවෘත බන්ධනාගාරය | 31,500 |
| වැලිකඩ බන්ධනාගාරය (කාන්තා) | 15,200 |
| නව මැගසින් බන්ධනාගාරය | 21,300 |
| කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය | 22,000 |
| බන්ධනාගාර රෝහල | 12,000 |
| බුද්ධි අංශය | 6,000 |
| පුහුණු මධ්‍යස්ථානය | 10,879 |
| ප්‍රධාන කාර්යාලය | 4,000 |
| නිල නිවාස | 5,500 |
| වැපල් පාර ගොඩනැගිල්ල | 9,000 |
| **එකතුව** | **137,397** |

(මූලාශ්‍රය - ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය)

(ආ) වැලිකඩ බන්ධනාගාර සංකීර්ණය හොරණ ප්‍රදේශයේ නැවත ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය නාගරික සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය හා බන්ධනාගාර දෙපාර්තමේන්තුව ඒකාබද්ධව සිදු කරනු ලබයි. මෙම ව්‍යාපෘතියට අදාළ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව, සැලසුම් හා නිර්මාණ කටයුතු, අභ්‍යන්තර මාර්ග, ජලය හා විදුලිය ඇතුළු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු සියයට 30 ක් පමණ නිම කර ඇත. කෙසේ නමුත් මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 03/2022 හා 2022.04.26 දිනැති චක්‍රලේඛය අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවා ඇත.

(ඇ) බන්ධනාගාර තදබදය අවම කිරීම සඳහා බන්ධනාගාර ධාරිතාවය වැඩි කලද කල්යාමේදී රැඳවියන් සංඛ්‍යාව වැඩි වීම නිසා බන්ධනාගාර වල තදබදය නැවත නිර්මාණය වේ. උදාහරණ වශයෙන් 2020 වර්ෂය අවසාන වන විට අගුණුකොලපැලැස්ස බන්ධනාගාරය, බන්ධනාගාර පද්ධතියට එකතු වීම නිසා බන්ධනාගාර ධාරිතාවය වැඩි වී බන්ධනාගාර තදබදය අවම කිරීමට යම් මට්ටමකට හැකි වුවද නැවත එය 2022 ජුනි මාසයේ සිට ක්‍රමයෙන් වැඩි වී 2022 දෙසැම්බර් 31දින වන විට නැවතත් බන්ධනාගාර තදබදය ඉහල මට්ටමක පැවතුණි. එබැවින් බන්ධනාගාර වල ධාරිතාවය වැඩි කිරීම සඳහා බන්ධනාගාර ඉදිකිරීම බන්ධනාගාර තදබදයට ප්‍රමාණවත් විසඳුමක් නොවේ.

### 3.4.2. සුළු වරදකරුවන් ප්‍රජා විශෝධන ක්‍රියාවලියට යොමු කිරීම.

ප්‍රජා විශෝධන ක්‍රියාවලිය යනු සුළු වරදකට අධිකරණය ඉදිරියේ වරද පිළිගැනීමෙන් පසු වරදකරු වන පුද්ගලයෙකුට බන්ධනාගාර ගත කිරීමක්, අත්හිටවූ සිර දඬුවමක් හෝ දඩ මුදලක් ගෙවීම වෙනුවට ලබා දිය හැකි විකල්ප දඬුවම් ක්‍රමයකි. ප්‍රජා පාදක විශෝධන ආඥා ක්‍රියාත්මක කිරීම මගින් සුළු වැරදිකරුවන් බන්ධනාගාර ගත කිරීම අවම කර බන්ධනාගාර තදබදය අඩු කිරීමට දායක වේ. නමුත් පහත කරුණු අනුව මෙම ක්‍රියාවලිය ප්‍රමාණවත් ආකාරයෙන් සිදුවී නොතිබුණි.

(අ) 2018 වර්ෂයේ සිට 2022 වර්ෂයේ පළමු මාස 06 දක්වා මහේස්ත්‍රාත් අධිකරණ මගින් නියෝග ලබා දී ඇති ආඥාලාභීන් ප්‍රමාණය සීඝ්‍රයෙන් අඩු වී ඇත. විස්තර පහත දැක්වේ.

| කාලපරිච්ඡේදය | වර්ෂය තුල ලබා දී ඇති ආඥා ප්‍රමාණය | 2018 වර්ෂයට සාපේක්ෂව ලබා දී ඇති ආඥා වල අඩු වීම | 2018 වර්ෂයට සාපේක්ෂව ලබා දී ඇති ආඥා වල අඩු වීම ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|
| 2018 වර්ෂය | 12,783 | - | - |
| 2019 වර්ෂය | 12,477 | 306 | 2.4 |
| 2020 වර්ෂය | 8,961 | 3,822 | 30.0 |
| 2021 වර්ෂය | 5,743 | 7,040 | 55.0 |
| 2022 පළමු මාස 06 | 3,244 | - | - |

(මූලාශ්‍රය - ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව)

(ආ) ප්‍රජා විශෝධනලාභීන් තම ප්‍රජා විශෝධන නියෝග නොයෙකුත් හේතු නිසා කඩකරන අවස්ථාද නිරීක්ෂණය වේ. 2018 සිට 2022 පළමු මාස 06 දක්වා කඩකර ඇති ආඥා ප්‍රමාණය පහත වගුවේ දක්වා ඇත.

| කාලපරිච්ඡේදය | කඩකර ඇති ආඥා ප්‍රමාණය | |
|---|---|---|
| | ප්‍රවර්ථන වර්ෂයට අදාළව | පෙර වර්ෂයට අදාළව |
| 2018 වර්ෂය | 1,881 | 1,067 |
| 2019 වර්ෂය | 2,102 | 853 |
| 2020 වර්ෂය | 1,205 | 884 |
| 2021 වර්ෂය | 609 | 697 |
| 2022 පළමු මාස 06 | 406 | 787 |

(මූලාශ්‍රය - ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව )

(ඇ) ඇතැම් වරදකරුවන් පුරුද්දක් වශයෙන් දඩ මුදල් ගෙවීම හා සිර දඬුවම් විඳීම වෙනුවට නැවත නැවත වරදවල් සිදුකර ප්‍රජා පාදක ආඥා ලබා ගැනීමට කටයුතු කරයි.

2018 වර්ෂයේ මුල සිට 2022 ජූලි 30 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ මීට පෙර ආඥාවක් ලබා ගෙන එය ඉටුකර නැවත ආඥාවක් සඳහා යොමු වූ ප්‍රමාණය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| කාලපරිච්ඡේදය | නැවත ආඥාවක් ලබා ගැනීමට ඉදිරිපත් වූ ආඥාලාභීන් සංඛ්‍යාව |
|---|---|
| 2018 වර්ෂය | 691 |
| 2019 වර්ෂය | 897 |
| 2020 වර්ෂය | 662 |
| 2021 වර්ෂය | 246 |
| 2022 පළමු මාස 06 | 161 |

(මූලාශ්‍රය - ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව )

(ඇ) 2018 වර්ෂයේ මුල සිට 2022 ජූලි 30 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ මීට පෙර ආඥාවක් ලබා ගෙන එය ඉටුකරන අතරතුර නැවත ආඥාවන් සඳහා යොමු වූ ප්‍රමාණය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| කාලපරිච්ඡේදය | මීට පෙර ආඥාවක් ලබා ගෙන එය ඉටුකරන අතරතුර නැවත ආඥාවන් සඳහා යොමු වූ ප්‍රමාණය |
|---|---|
| 2018 වර්ෂය | 98 |
| 2019 වර්ෂය | 84 |
| 2020 වර්ෂය | 81 |
| 2021 වර්ෂය | 48 |
| 2022 පළමු මාස 06 | 66 |

(මූලාශ්‍රය - ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව )

(ඉ) 2018 වර්ෂයේ මුල සිට 2022 ජුලි 30 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ මීට පෙර ආඥාවක් ලබා ගෙන එය කඩකර තිබියදී නැවත ආඥාවක් ලබා ගැනීම සඳහා යොමු වූ ආඥාලාභීන් ප්‍රමාණය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| කාලපරිච්ඡේදය | මීට පෙර ආඥාවක් ලබා ගෙන එය කඩකර තිබියදී නැවත ආඥාවක් ලබා ගැනීම සඳහා යොමු වූ ආඥාලාභීන් ප්‍රමාණය |
|---|---|
| 2018 වර්ෂය | 06 |
| 2019 වර්ෂය | 08 |
| 2020 වර්ෂය | 10 |
| 2021 වර්ෂය | 14 |
| 2022 පළමු මාස 06 | 28 |

(මූලාශ්‍රය - ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව )

(ඊ) සුළු වැරදි කරුවන් බන්ධනාගාර ගත කිරීමකින් තොරව සමාජය තුලම තබමින් විශෝධන ක්‍රමවේදයන් හරහා නිවැරදි පුද්ගලයන් බවට පත් කිරීමේදී දඬුවම් කාලයට වඩා විශෝධන ක්‍රියාවලිය සඳහා වැඩි කාලයක් ගත වේ. එම කාලය තුලදී ආඥාලාභීන් ප්‍රජා පාදක විශෝධන ආඥා කඩකිරීමට පෙළඹේ.

### 3.4.3. සිරකරුවන් හට නිවාස නිවාඩු ලබා දීම

සිර දඬුවම් කාලය තුල පුනරුත්ථාපනය වී ඉතා යහපත් කල්ක්‍රියාවෙන් සිටින සිරකරුවන්ගේ සාමාජීය හා පවුල් සම්බන්ධතා වර්ධනය කිරීම පිණිස අපරාධ වැලැක්වීමේ ආඥා පනතේ 11 වන වගන්තිය ප්‍රකාරව සිරකරුවන් තාවකාලික කාලයකට නිවාස නිවාඩු යැවීමේ ක්‍රමය බන්ධනාගාර පද්ධතිය තුල ක්‍රියාත්මක වේ.

නිවාස නිවාඩු පළමු වතාවට දින 07ක් ද, දෙවන වාතාවට දින 10ක් ද, තෙවන වතාවට දින 14ක් වශයෙන් ලබා දෙනු ලබයි. මෙම නිවාස නිවාඩු යැවීමේදී මෙම කොන්දේසි කඩ නොකර සාර්ථකව ගත කිරීම බලපත්‍ර මත නිදහස් කිරීමට විශේෂ සුදුසුකමක් වේ.

**2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා එක් එක් වර්ෂයේ නිවාස නිවාඩු මත මුදාහල සිරකරුවන් ප්‍රමාණය පිළිබඳ විස්තර පහත පරිදි වේ.**

| වර්ෂය | නිවාස නිවාඩු මත මුදාහල සිරකරුවන් සංඛ්‍යාව | එක් එක් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සිරකරුවන් සංඛ්‍යාව | නිවාස නිවාඩු මත මුදාහල සිරකරුවන් මුළු සිරකරුවන්ගෙන් ප්‍රතිශතයක් ලෙස (%) | මුළු රැඳවියන් සංඛ්‍යාව | නිවාස නිවාඩු මත මුදාහල සිරකරුවන් මුළු රැඳවියන්ගේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|---|
| 2018 | 378 | 9,287 | 4 | 23,364 | 2 |
| 2019 | 446 | 10,466 | 4 | 25,108 | 2 |
| 2020 | 128 | 6,870 | 1.8 | 19,399 | 1 |
| 2021 | 266 | 7,356 | 3.6 | 18,373 | 1 |
| 2022 | 275 | 9,449 | 2.9 | 26,176 | 1 |

(මූලාශ්‍රය - බන්ධනාගාර දෙපාර්තමේන්තු සංඛ්‍යාලේඛන වාර්තාව 2022 වර්ෂය)

මෙම ක්‍රමය තුළින් සිරකරු රැඳවියන් ප්‍රමාණය අඩු කිරීමට විසඳුමක් ලබා දුන්නද, සැකකරු රැඳවියන් ප්‍රමාණය අවම කිරීම සඳහා මෙම ක්‍රමය තුළින් විසඳුමක් ලබා නොදෙන අතර රැඳවියන්ගෙන් බහුතරයක් සැකකරුවන් වන බැවින් බන්ධනාගාර තදබදය සඳහා මෙම ක්‍රමය තුළින්ද අපේක්ෂිත ප්‍රතිඵල ලගාකර ගෙන නොතිබුණි.

### 3.4.4. සිරකරුවන් බලපත්‍ර මත මුදා හැරීම

නිවාස නිවාඩු යැවීමේ ක්‍රමය සඳහා සුදුසුකම් ලබන සිරකරුවන් බලපත්‍ර මත මුදාහැරීම සිදු කරනු ලබයි. සිරකරුවන් පුනරුත්ථාපනය කිරීමේ සංකල්පය යටතේ අධ්‍යාපනික, ආගමික, ආධ්‍යාත්මික, සංස්කෘතික, වෘත්තීය පුහුණු, පොදු කටයුතු යනාදි වැඩසටහන් සඳහා සිරකරුවන් යොමු කිරීමෙන් පසු නිවාස නිවාඩු ක්‍රමය යටතේ සාර්ථකව සිටින රැඳවියන් බලපත්‍ර ක්‍රමය යටතේ නැවත සමාජගත කෙරේ.

**2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා එක් එක් වර්ෂයේ බලපත්‍ර මත මුදාහල සිරකරුවන් ප්‍රමාණය පිළිබඳ විස්තර පහත පරිදි වේ.**

| වර්ෂය | බලපත්‍ර මත මුදාහල සිරකරුවන් සංඛ්‍යාව | එක් එක් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සිරකරුවන් සංඛ්‍යාව | බලපත්‍ර මත මුදාහල සිරකරුවන් මුළු සිරකරුවන්ගෙන් ප්‍රතිශතයක් ලෙස (%) | මුළු රැඳවියන් සංඛ්‍යාව | බලපත්‍ර මත මුදාහල සිරකරුවන් මුළු රැඳවියන්ගේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|---|
| 2018 | 167 | 9,287 | 1.8 | 23,364 | 0.71 |
| 2019 | 200 | 10,466 | 1.9 | 25,108 | 0.80 |
| 2020 | 161 | 6,870 | 2.3 | 19,399 | 0.83 |
| 2021 | 36 | 7,356 | 0.5 | 18,373 | 0.20 |
| 2022 | 96 | 9,449 | 1 | 26,176 | 0.37 |

(මූලාශ්‍රය - බන්ධනාගාර දෙපාර්තමේන්තු සංඛ්‍යාලේඛන වාර්තාව 2022 වර්ෂය)

සිරකරුවන් හට නිවාස නිවාඩු ලබා දීමේ ක්‍රමවේදය මෙන්ම සිරකරුවන් බලපත්‍ර මත මුදාහැරීමේ දී ද, සිරකරුවන් ප්‍රමාණය අඩු කිරීමට විසඳුමක් ලබා දුන්නද, එය මුළු සිරකරුවන්ගේ ප්‍රමාණයෙන් සියයට 3 කට වඩා අඩු ප්‍රතිශතයකි. මෙම ක්‍රමය මගින්ද බන්ධනාගාර තදබදය අවම කිරීමේ අපේක්ෂිත ඵලදායී තත්ත්වය ලඟා කරගෙන නොතිබුණි.

### 3.4.5. බන්ධනාගාර රැඳවියන් විශේෂ රාජ්‍ය සමාව ලබා දීමේ ක්‍රියාවලිය යටතේ නිදහස් කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව කොන්දේසි වලට යටත්ව සිරකරුවන් සඳහා ජනාධිපතිවරයා විසින් විශේෂ රාජ්‍ය සමාව ප්‍රදානය කරනු ලැබේ. 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර ගත සිරකරුවන් සංඛ්‍යාවට සාපේක්ෂව විශේෂ රාජ්‍ය සමාව යටතේ නිදහස් වූ රැඳවියන් සංඛ්‍යාව පහත පරිදි වේ.

2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා එක් එක් වර්ෂයේ රාජ්‍ය සමාව යටතේ මුදාහල සිරකරුවන් ප්‍රමාණය පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| වර්ෂය | විශේෂ රාජ්‍ය සමාව මත මුදාහල සිරකරුවන් සංඛ්‍යාව | එක් එක් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සිරකරුවන් සංඛ්‍යාව | විශේෂ රාජ්‍ය සමාව මත මුදාහල සිරකරුවන් මුළු සිරකරුවන්ගෙන් ප්‍රතිශතයක් ලෙස (%) | මුළු රැඳවියන් සංඛ්‍යාව | විශේෂ රාජ්‍ය සමාව මත මුදාහල සිරකරුවන් මුළු රැඳවියන්ගේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|---|
| 2018 | 918 | 9,287 | 9.9 | 23,364 | 3.9 |
| 2019 | 1,461 | 10,466 | 14 | 25,108 | 5.8 |
| 2020 | 1,963 | 6,870 | 28.6 | 19,399 | 10.1 |
| 2021 | 629 | 7,356 | 8.6 | 18,373 | 3.4 |
| 2022 | 1,322 | 9,449 | 14 | 26,176 | 5 |

(මූලාශ්‍රය - බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අංශය)

සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර ගත රැඳවියන්ගේ ප්‍රමාණයට සාපේක්ෂව විශේෂ රාජ්‍ය සමාව ප්‍රදානය යටතේ නිදහස් කරනු ලබන රැඳවියන් ප්‍රමාණය ඉතා සුළු ප්‍රතිශතයක් වේ. එයට හේතුව රැඳවියන් අතුරින් සිරකරුවන් සඳහා විශේෂ රාජ්‍ය සමාව ප්‍රදානය කරනු ලැබුවද බන්ධනාගාර ගත වන සැකකරුවන් සංඛ්‍යාව ඊට වඩා ඉහළ අගයක පැවතීමයි. බන්ධනාගාර රැඳවියන් පොදු සමාව ප්‍රදානය යටතේ නිදහස් කරනු ලැබුවද බන්ධනාගාර තදබදය සඳහා මෙය ද ප්‍රමාණවත් විසඳුමක් වී නොමැත. මීට අමතරව විශේෂ රාජ්‍ය සමාව ලබා දීමේ ක්‍රියාවලිය යටතේ නිදහස් කිරීමේ දී උපලේඛන 02 හි සඳහන් වැරදි 28 ක් සඳහා සමාව හිමි නොවන බවද නිරීක්ෂණය විය.

## 4. නිර්දේශ

(අ) 1877 අංක 16 දරණ බන්ධනාගාර ආඥා පනතේ 54 වන අධිකාරයට අදාළව සිදුකරන ලද සංශෝධනයන් හි 178 හා 179 පරිච්ඡේදයේ විධිවිධානවලට අනුව කටයුතු කිරීම

(ආ) නැවත නැවත සිරගත වීම අවම කිරීම සඳහා ශක්තිමත් හා ප්‍රමාණවත් පුනරුත්ථාපන ක්‍රියාවලියක් ඇති කිරීම සහ ජීවනෝපාය පුහුණු කිරීම් ශක්තිමත් කිරීම.

(ඇ) පූර්ව නඩු විභාග රඳවා ගැනීම් චෝදනා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් අවම කිරීමට අදාළ පාර්ශවයන් මෙහෙය වීම.

(ඈ) රිමාන්ඩ් බන්ධනාගාරගත කිරීම වෙනුවට නිවාස අඩස්සියේ තබා ගැනීම වැනි විකල්ප පිළිගත් ක්‍රම ශ්‍රී ලංකා අපරාධ යුක්ති පද්ධතියට හඳුන්වා දීම පිළිබඳව අවධානය යොමු කර සුදුසු පියවර ගැනීම.

(ඉ) 2022 අංක 41 දරන විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග සංශෝධන පනතේ 54 වන වගන්තිය අනුව අධිකරණය මගින් බන්ධනාගාර ගත කරන සැකකරුවන්ට අදාළව පොලිස් දෙපාර්තමේන්තුව විසින් රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන නියැදි (sample)වලට අදාළ රස පරීක්ෂක වාර්තා අධිකරණයට අප්‍රමාදව ඉදිරිපත් කිරීම.

(ඊ) අපරාධ යුක්ති දාම ප්‍රවේශයේ පවතින ආයතන අතර සහයෝගිතා යාන්ත්‍රණය වැඩි දියුණු කිරීම සහ හැකිතාක් නවීණ තාක්ෂණය උපයෝගී කර ගැනීම

(උ) බන්ධනාගාර තදබදය හා අනෙකුත් ගැටළු සම්බන්ධව බන්ධනාගාර පරිපාලකයන් හා අධිකරණ නිලධාරීන් දැනුවත් කිරීම හා කාර්යක්ෂම අධීක්ෂණ යාන්ත්‍රණයක් පවත්වා ගැනීම

(ඌ) නේවාසිකයින්ගේ නවාතැන් හා රැකවරණය සඳහා වූ ජාත්‍යන්තර හා ජාතික ප්‍රමිතීන්ට අනුකූලව රැඳවියන් බන්ධනාගාර ගත කිරීමට කටයුතු කිරීම.

(එ) බන්ධනාගාර කළමනාකරණයට පහසු වන පරිදි සමාජ ආරක්ෂණයට හානියක් නොවන සේ මත්ද්‍රව්‍ය වැරදි හා සම්බන්ධ නීති සංශෝධනය කිරීම පිළිබඳව අවධානය යොමු කිරීම.

(ඒ) පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මානව හා භෞතික සම්පත් ප්‍රමාණවත් පරිදි යොදවා ගැනීම සහ අවශ්‍ය සංශෝධනයන් සිදු කිරීම.

(ඔ) තාවකාලිකව ක්‍රියාත්මක කිරීම අත්හිටුවා ඇති වැලිකඩ බන්ධනාගාර සංකීර්ණය සුදුසු ප්‍රදේශයක ස්ථාපිත කිරීම.

(ඕ) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යමණ්ඩලයේ දැනට පුරප්පාඩු වී ඇති අත්‍යාවශ්‍ය තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීම කඩිනමින් සිදු කිරීම.

(ක) බන්ධනාගාරවල අබලන්ව ඇති සනීපාරක්ෂිතභාවයෙන් හා ආරක්ෂිතභාවයෙන් අඩු ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම හෝ නව ගොඩනැගිලි ඉදිකර රැඳවියන්ගේ මානුෂික අවශ්‍යතා ඉටු කිරීම.

(ග) රැඳවියන්ගේ ශ්‍රමය හා දැනුම සමාජයීය වශයෙන් ඵලදායී කාර්යය සඳහා යොමු කරවීම වර්ධනය කිරීම.

(ජ) බන්ධනාගාර නේවාසික තදබදය අවම කර විධිමත් පුනරුත්ථාපන ක්‍රියාවලියක් මඟින් නේවාසිකයින් යහපත් පුරවැසියන් ලෙස සමාජ ගත කිරීම.

ඩබ්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

2023 සැප්තැම්බර් 26 දින

උපලේඛන අංක 01

## 2022 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු

| අනු අංකය | තනතුර සහ නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | තත්‍ය කාර්යය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | බන්ධනාගාර කොමසාරිස් ජනරාල් | 01 | 01 | - | - |
| 02 | අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල් | 01 | - | 01 | - |
| 03 | බන්ධනාගාර කොමසාරිස් (ශ්‍රී.ල.ප.සේ) | 01 | - | 01 | - |
| 04 | බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන තනතුර සමග) | 05 | - | 05 | - |
| 05 | අධ්‍යක්ෂ (සැලසුම්) | 01 | - | 01 | - |
| 06 | අධ්‍යක්ෂ (ඉංජිනේරු) | 01 | - | 01 | - |
| 07 | ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | - | - |
| 08 | ස. කොමසාරිස්/ නි. කොමසාරිස් (ශ්‍රී.ල.ප.සේ) | 01 | - | 01 | - |
| 09 | ස. අධ්‍යක්ෂ / නි. කොමසාරිස් (සැලසුම්) | 01 | 01 | - | - |
| 10 | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ සේවය) | 01 | 01 | - | - |
| 11 | සහකාර අධ්‍යක්ෂ (කෘෂිකර්ම) | 01 | - | 01 | - |
| 12 | ගණකාධිකාරී | 04 | 02 | 02 | - |
| 13 | අභ්‍යන්තර විගණක | 01 | 01 | - | - |
| 14 | බන්ධනාගාර අධිකාරී (විශේෂ ශේණිය) | 06 | 04 | 02 | - |
| | බන්ධනාගාර අධිකාරී (විශේෂ ශ්‍රේණිය - පුනරුත්ථාපන) | 01 | 0 | 01 | - |
| 15 | බන්ධනාගාර අධිකාරී | 17 | 07 | 10 | - |
| | බන්ධනාගාර අධිකාරී (පුනරුත්ථාපන) | 02 | - | 02 | - |
| 16 | සහකාර බන්ධනාගාර අධිකාරී (පිරිමි) | 40 | 09 | 31 | - |
| | සහකාර බන්ධනාගාර අධිකාරී (පුනරුත්ථාපන) | 03 | - | 03 | - |
| 17 | සහකාර බන්ධනාගාර අධිකාරී (කාන්තා) | 02 | - | 02 | - |
| 18 | නීති නිලධාරී | 01 | 01 | - | - |
| 19 | ඉංජිනේරු (සිවිල්) | 02 | 02 | - | - |
| 20 | ඉංජිනේරු (යාන්ත්‍රික) | 02 | 02 | - | - |
| 21 | අධ්‍යක්ෂ (වෛද්‍ය) | 01 | - | 01 | - |
| 22 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (වෛද්‍ය) | 01 | 01 | - | - |
| 23 | වෛද්‍ය නිලධාරී | 40 | 42 | - | 02 |
| 24 | දන්ත වෛද්‍ය නිලධාරී | 04 | 04 | - | - |
| 25 | පරිපාලන නිලධාරී | 02 | - | 02 | - |
| 26 | ප්‍රධාන වැඩ පරීක්ෂක | 01 | - | 01 | - |
| 27 | විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී | 01 | - | 01 | - |
| 28 | භාෂා පරිවර්තක | 03 | 02 | 01 | - |
| 29 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 01 | - | 01 | - |
| 30 | සංඛ්‍යා ලේඛන නිලධාරී | 01 | 01 | - | - |
| 31 | ප්‍රධාන ජේලර් (කාන්තා) | 03 | - | 03 | - |
| 32 | ප්‍රධාන ජේලර් (පිරිමි) | 30 | 27 | 03 | - |
| 33 | I පෙළ ජේලර් (කාන්තා ) | 04 | 02 | 02 | - |
| 34 | I පෙළ ජේලර් (පිරිමි ) | 59 | 54 | 05 | - |
| 35 | ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරී (පිරිමි) | 05 | 03 | 02 | - |
| 36 | ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරී (කාන්තා) | 02 | 01 | 01 | - |
| 37 | පුනරුත්ථාපන නිලධාරී (I පෙළ) | 11 | 07 | 04 | - |
| 38 | පුනරුත්ථාපන නිලධාරී (I පෙළ කාන්තා) | 02 | 01 | 01 | - |
| 39 | ලියාපදිංචි / සහකාර වෛද්‍ය නිලධාරී | 19 | 23 | - | 04 |
| 40 | ඖෂධ සංයෝජක (විශේෂ ශ්‍රේණිය) | 04 | - | 04 | - |
| 41 | සංවර්ධන නිලධාරී | 94 | 97 | - | 03 |
| 42 | උපදේශන නිලධාරී | 07 | - | 07 | - |
| 43 | වැඩ පරීක්ෂක | 05 | - | 05 | - |
| 44 | පුස්තකාලාධිපති | 01 | - | 01 | - |
| 45 | තාක්ෂණ නිලධාරී (කාර්මික) | 01 | - | 01 | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| 46 | සැලසුම් ශිල්පී | 02 | 01 | 01 | - |
| 47 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ(සහකාර) | 05 | 02 | 03 | - |
| 48 | උප වැඩ පරීක්ෂක | 10 | 05 | 05 | - |
| 49 | රාජ්‍ය කළමනාකාර සහකාර | 80 | 47 | 33 | - |
| 50 | භාෂණ පරිවර්තක | 02 | - | 02 | - |
| 51 | කර්මාන්ත වැඩ මූලික | 19 | 18 | 01 | - |
| 52 | කර්මාන්ත පරිපාලක | 17 | 15 | 02 | - |
| 53 | I පෙළ/ II පෙළ වෘත්තීය උපදේශක නිලධාරී | 120 | 48 | 72 | - |
| 54 | කෘෂි උපදේශක | 19 | 07 | 12 | - |
| 55 | කෘෂිකර්මාන්ත ඕවර්සියර් | 28 | - | 28 | - |
| 56 | ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර | 01 | - | 01 | - |
| 57 | ඖෂධ සංයෝජක (I, II, III ශ්‍රේණිය) | 82 | 55 | 27 | - |
| 58 | රසායනාගාර කාර්මික විද්‍යාඥ | 04 | 05 | - | 01 |
| 59 | හෙද නිලධාරී (අධි ශ්‍රේණිය) | 03 | - | 03 | - |
| | හෙද නිලධාරී (III, II, I) | 75 | 35 | 40 | - |
| 60 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | 04 | 07 | - | 03 |
| 61 | II පෙළ පුනරුත්ථාපන නිලධාරී (පිරිමි) | 109 | 93 | 16 | - |
| 62 | II පෙළ පුනරුත්ථාපන නිලධාරී (කාන්තා) | 25 | 20 | 05 | - |
| 63 | II පෙළ ජේලර් (කාන්තා ) | 30 | 18 | 12 | - |
| 64 | II පෙළ ජේලර් (පිරිමි ) | 446 | 371 | 75 | - |
| 65 | සරඹ උපදේශක | 03 | 01 | 02 | - |
| 66 | සැරයන් (කාන්තා) | 38 | 22 | 16 | - |
| 67 | සැරයන් (පිරිමි) | 892 | 604 | 288 | - |
| 68 | නියාමක (කාන්තා) | 594 | 497 | 97 | - |
| 69 | නියාමක (පිරිමි) | 4447 | 3799 | 648 | - |
| 70 | ඡායාරූප ශිල්පී | 01 | - | 01 | - |
| 71 | සංස්කරණ ශිල්පී | 01 | - | 01 | - |
| 72 | මෝටර් රියදුරු (දෙපාර්තමේන්තු ගත) | 222 | 203 | 19 | - |
| 73 | මෝටර් රියදුරු (ඒකාබද්ධ සේවය) | 05 | 01 | 04 | - |
| 74 | ගිලන් රථ රියදුරු | 03 | - | 03 | - |
| 75 | මෝටර් කාර්මික | 10 | 03 | 07 | - |
| 76 | මෝටර් කාර්මික (විදුලි) | 04 | 01 | 03 | - |
| 77 | මෝටර් කාර්මික (වෑද්දුම්) | 02 | - | 02 | - |
| 78 | මෝටර් කාර්මික (පින්තාරු) | 02 | - | 02 | - |
| 79 | ට්‍රැක්ටර් රියදුරු | 26 | 15 | 11 | - |
| 80 | ත්‍රීවිල් රියදුරු | 08 | 06 | 02 | - |
| 81 | කාර්යාල සේවක සේවයේ තනතුරු | 36 | 18 | 18 | - |
| 82 | මුරකරු | 52 | 28 | 24 | - |
| 83 | වධක | 02 | 02 | - | - |
| 84 | කම්කරු | 35 | 17 | 18 | - |
| 85 | වතුර පොම්ප ක්‍රියාකරු | 10 | 07 | 03 | - |
| | **එකතුව** | **7872** | **6268** | **1617** | **13** |

**උපලේඛන අංක 02**

**විශේෂ රාජ්‍ය සමාව ලබා දීමේ ක්‍රියාවලිය යටතේ නිදහස් කිරීමේ දී සමාව හිමි නොවන වැරදි**

| අනු අංකය | වරද | දණ්ඩනීති සංග්‍රහයේ වගන්තිය |
|---|---|---|
| 01 | නීති විරෝධි රැස්වීම | 140 සිට 142 සහ 146 |
| 02 | මංකොල්ල | 380, 382 සහ 383 |
| 03 | ගෙවල් බිඳීම සහ රාත්‍රි කාලයේ ගෙවල් බිඳීම | 431, 432, 440 හා 441 ගෙවල් බිඳීම<br>443 සහ 446 රාත්‍රි ගෙවල් බිඳීම |
| 04 | රාජ්‍ය ද්‍රෝහි ක්‍රියා | 114 - 123 |
| 05 | පැහැරගෙන යාම | 354 - 360 |
| 06 | අසභ්‍ය ප්‍රකාශන ළමුන්ට අදාළ ප්‍රදර්ශණය | 286 A |
| 07 | ළමුන්ට හිංසා කිරීම | 308 A |
| 08 | ණය බැඳුම්කර හෝ දාස භාවයට පත්කිරීම, බලහත්කාරයෙන් වැඩ ගැනීම, වහල්කමට භාජනය කිරීම සහ යුද්ධයේ යෙදවීම සඳහා ළමයින් බඳවා ගැනීම | 358 A |
| 09 | කූට්ටනය | 360 A |
| 10 | ළමයින්ගෙන් අයුතු ලෙස ලිංගික ප්‍රයෝජන ගැනීම | 360 B |
| 11 | තැනැත්තන් වෙළදාම් කිරීම | 360 C |
| 12 | ළමයෙකු පොළඹවා ගැනීමට ඇවිටිලි කිරීම | 360 E |
| 13 | දූෂණය කිරීම | 364 |
| 14 | ව්‍යාභිචාරය | 364 A |
| 15 | අස්වාභාවික ලිංගික වැරදි | 365 |
| 16 | බරපතල ලිංගික අයථා ක්‍රියා | 365 B |
| 17 | අල්ලස් පනත යටතේ වැරදිකරුවන් වූවන් | |
| 18 | 1966 අංක 18 දරණ පීඩාකාරී ආයුධ පනතේ වැරදි | |
| 19 | ගිණිඅවි ආඥා පනත යටතේ වැරදිකරුවන් වූවන් | |
| 20 | 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය මර්ධන (තාවකාලික) විධි විධාන පනත යටතේ වැරදි | |
| 21 | 1982 අංක 24 දරණ ගුවන්යානා එරෙහි පනත යටතේ වැරදි | |
| 22 | වස, අබිං හා අන්තරායකර ඖෂධ පනත යටතේ වැරදි | |
| 23 | හදිසි නීතිය යටතේ ගැනෙන වැරදි | |
| 24 | ආදායම් බදු නඩුවල මුදල් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් සිර දඩුවම් විඳින්නන් | |
| 25 | 2006 අංක 05 දරණ නීති විරෝධි මුදල් රඳවාගැනීම වැලැක්වීමේ පනත යටතේ වැරදිකරුවන් කරනු ලැබූ අය. | |
| 26 | 2006 අංක 06 දරණ මූල්‍ය ගණුදෙනු වාර්තාකරණය යටතේ වරදකරුවන් කරනු ලැබූ අය. | |
| 27 | 2005 අංක 25 දරණ සත්‍ය වසන්කර ත්‍රස්තවාදයට මූල්‍යාධාර සැපයීමේ පනත යටතේ වරදකරුවන් කරනු ලැබූ අය. | |
| 28 | ඉහත අංක 01 සිට 27 යටතේ දැක්වෙන වැරදි සම්බන්ධයෙන් යුධ හමුදා පනත, නාවුක හමුදා පනත හෝ ගුවන් හමුදා පනත යටතේ යුද්ධාධිකරණය විසින් වැරදි කරුවන් කරනු ලැබූ අය. | |